# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,961 — 1964 පෙබරවාරි 28 වැනි සිකුරාද — 1964.2.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 245 | කොටුපල් මේන්ද හා වෙනත් මේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 253 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 259 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | 283 | වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 286 | විවිධ දන්වීම් ... ... ... | 286 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලි රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන, සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" සි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත්, ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණ යකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට හැඟෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත්

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබාඇති අයගේ නම් සහ තරාතිරම් (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි, සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුව හොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–814—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුර I ශ්‍රේණිය

I ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරක් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :** මෙ තනතුරෙහි වැටුප් පරිමාණය වර්ෂයකට රුපියල් 2,820—9 × 120 සහ 8 × 180—රුපියල් 5,340 වේ.

3. **සේවා කොන්දේසි :** (i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ.

(iii) තෝරාගන්නා ආධුනිකයා දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :

(i) (අ) ගණිතය සමග උසස් ගණිතය, යාන්ත්‍රික විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් සහිතව ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතු අතර ;

(ආ) පිළිගත් සිවිල්, යාන්ත්‍රික විදුලි හෝ කෘෂිකර්ම ඉංජිනේරු කර්මාන්ත ශාලාවක අවුරුදු 8 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. ආධුනික කාලසීමාව මීට ඇතුළත් නොවිය යුතුය ; හෝ

(ii) (අ) ලංකා කාර්මික විද්‍යාලයෙහිදී කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨ මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයකු විය යුතු අතර ;

(ආ) පිළිගත් සිවිල්, යාන්ත්‍රික, විදුලි හෝ කෘෂිකර්ම ඉංජිනේරු කර්මාන්ත ශාලාවක අවුරුදු 6 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. ආධුනික කාලසීමාව මීට ඇතුළත් නොවිය යුතුය.

(iii) රජයේ සේවාවේ නියුක්තව සිටින අවුරුදු 40 කට වැඩි වයසැත්තාවූද ආධුනික කාල සීමාවත් සමග අවුරුදු 15 ක පළපුරුද්දක් ඇත්තාවූද ඉන් අවුරුදු 8 කට නොඅඩු කාලයක් පරිපාලන (සුපරීක්ෂක) තත්ත්වයක් ඉසුලුවාවූද අපේක්ෂකයන්ගේ අයදුම්පත්ද සැලකිල්ලට භාජනය කෙරේ.

(iv) 64.3.1 වැනි දින වන විට අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 30 කට නොඅඩු විය යුතුය. මනා ශරීර සනීපයෙන් යුක්ත විය යුතු අතර යහපත් චරිතයක් තිබිය යුතුය.

**සැලකිය යුතුයි :** (i) (අ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ගැන නොසළකා දෙපාර්තමේන්තුවේ සේවාවෙහි නියුක්ත අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍රද භාරගනු ලැබේ. එහෙත් සෙසු සියලු සුදුසුකම් ඇත්තවුන් විය යුතුය.

5. අපේක්ෂකයන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට අමුනා එවිය යුතුයි :

(1) උප්පැන්න සහතිකයේ පිටපත ;

(2) උසස්තම අධ්‍යාපන සහතිකයේ පිටපත ;

(3) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත් ;

(4) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රවල පිටපත්.

6. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙළ කළ අයදුම්පත්‍ර 1964 මාර්තු මස 23 වැනි දිනට පෙර පේරාදෙනියේ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට ලැබෙන සේ එවිය යුතුයි. එම අයදුම්පත්‍ර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසි බලන්න.

ඒ. වී. ඇම්. සිල්වා,
වැ. බ. කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 පෙබරවාරි මස 18 වැනි දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### I ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරු සඳහා අයදුම් පත්‍රයයි

1. නම :————.

නම :————.

වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1964 මාර්තු මස 1 වැනි දිනට වයස සහ උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි)

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.
(අ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.
(ආ) ඔබ ලාංකිකයෙක් ද :————.
(i) උප්පත්තියෙන් ද ?————.
(ii) නැතහොත් ලියා පදිංචි කරවා ගැනීමෙන් ද ?

7. ලබා ඇති උසස්තම අධ්‍යාපන සුදුසුකම් :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

8. කාර්මික සුදුසුකම් :————.

9. පළපුරුද්ද :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. අමුණා ඇති චරිත සහතික පත් දුන් තිදෙනාගේ නම් සහ ලිපිනයන් :————.

1 :————.

2 :————.

3 :————.

මවිසින් මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින්ම මා නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බවත් මෙයින් දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.
පේරාදෙනියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා වෙතටයි.

2–770/1—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරු

II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප :** මේ තනතුරට අදාල වාර්ෂික වැටුප් පරිමාණය රු. 1,860—120 × 16—රු. 3,780 ක් වේ.

3. **සේවා කොන්දේසි :** (1) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(2) පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ.

(3) තෝරාගනු ලබන අපේක්ෂකයෝ දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(1) (අ) ගණිතය ඇතුළු උසස් ගණිතය, යාන්ත්‍රික බලබම් විද්‍යාව ( ) හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකකකින් හෝ වැඩි ගණනකින් යුක්තව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතු අතර

(ආ) පිළිගත්, සිවිල්, යාන්ත්‍රික හෝ කෘෂිකාර්මික ආයතනයක ආධුනික කාල සීමාව හැර තවත් අවුරුදු පහක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

නැතහොත්

(2) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨ මාලාව සාර්ථක අන්දමින් අවසන් කර තිබිය යුතු අතර පිළිගත් සිවිල්, යාන්ත්‍රික, විදුලි හෝ කෘෂිකාර්මික ඉංජිනේරු ආයතනයක ආධුනික කාලය හැර තවත් අවුරුදු 3 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(3) වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර මනාචරිතයකින් හා හොඳ ශාරීරික සනීපයකින් යුක්ත විය යුතුය.

**සංලක්ෂ්‍යය :** (1) (අ) ඡේදයෙහි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් වලින් තොර වුවද සෙසු සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ සේවාවේ යෙදී සිටින අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍රද භාරගනු ලැබේ.

5. සෑම අපේක්ෂකයෙකුම තමාගේ අයදුම් පතට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ පිටපත ;

(2) ලබා ඇති උසස්තම අධ්‍යාපන සහතිකයේ පිටපත ;

(3) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත් ;

(4) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රවල පිටපත්.

6. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙළ කරන ලද අයදුම් පත් 1964 මාර්තු මස 23 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙනියේ කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි. එවැනි ඉල්ලුම්පත්‍ර කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළව ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාලවූ පොදු කොන්දේසි කියවා බලන්න.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැ. බ. කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 පෙබරවාරි මස 18 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරු සඳහා අයදුම් පත්‍රයයි

1. නම :————.

නම :————.

වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1964 මාර්තු මස 1 වැනි දිනට වයස සහ උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි)

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරුගේ පියා :————

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

(ආ) ඔබ ලාංකිකයෙක්ද :————.

(i) උප්පත්තියෙන්ද ?————.

(ii) නැතහොත් ලියා පදිංචි කරවා ගැනීමෙන්ද ?

7. ලබා ඇති උසස්තම අධ්‍යාපන සුදුසුකම් :—.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————

(ඇ) ඉංග්‍රීසි :————

8. කාර්මික සුදුසුකම් :————.

9. පළපුරුද්ද :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. අමුණා ඇති චරිත සහතික පත් දුන් තිදෙනාගේ නම් සහ ලිපිනයන් :————.

1 :————.

2 :————.

3 :————.

මවිසින් මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින්ම මා නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව දනගන්නට ලැබුණහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බවත් මෙයින් දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.
පේරාදෙනියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතටයි.

2–770/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ඇටෝර්නි ජනරාල්ගේ දෙපාර්තමේන්තුව

### පෙරකදෝරු ලිපිකරු තනතුරු

මේ දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ පෙරකදෝරු කාර්යාලයේ පෙරකදෝරු ලිපිකරු තනතුරු දෙකක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම්පත්, කොළඹ 12, තැ. පෙ. අංක 502 දරණ තැන වන ඇටෝර්නි ජනරාල් වෙත 1964 මාර්තු 13 වන දින හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,248—72—රු. 2,184.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම යට දැක්වෙන සුදුසුකම් තිබෙන බව ඔප්පුවන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) වයසින් අවුරුදු 21 නොඅඩු හා 45 ට නොවැඩි බව.

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, අංක ගණිතය/ගණිතය, ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ඊට සම හෝ උසස් විභාගයකින් සමත් වී සිටීම.

(ඇ) අවුරුදු 10ක කෘතහස්ත භාවයක් සහිත පෙරකදෝරු කෙනකු යටතේ පෙරකදෝරු ලිපිකරුවකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් හෝ සෑහෙන කාලයක් පවත්වාගෙන ආ නීතිඥ ව්‍යාපාර ආයතනයක පෙරකදෝරු ලිපිකරුවකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් යටත් පිරිසෙයින් ලබා තිබීම.

5. නීති දෙපාර්තමේන්තුවක වසර 7 කට නොඅඩු පළපුරුද්දක් ඇති, පිටපත් ලිපිකරුවන්, දිස්ත්‍රික් ලිපිකාරසේවයේ නිලධාරීන්, සහ අධි ලිපිකාර සේවයේ නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම් පත් වයස සහ අධ්‍යාපනික සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නියමිත දිනට පෙර භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගතහැකි කරුණු දක්වමින්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඒවා පිළිගත්තා ලෙස නිර්දේශ කළොත් මිස බාරගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් එවිය යුත්තේ කොළඹ 12, තැ. පෙ. අංක 502 දරණ තැන, ඇටෝර්නි ජනරාල් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ හෝ මගේ පෞද්ගලික නමට නොවේ.

8. සම්මුඛ පරීක්ෂණයක් සඳහා මේ කාර්යාලයට පැමිණෙන ලෙස අයදුම්කරුවන්ට නියම කෙරෙනු ඇත. ඒ සඳහා වන වියදම් ඔවුන්ම දැරිය යුතුවේ.

9. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි පළකර තිබෙන රාජ්‍යසේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි. තවද, නව ප්‍රවේශකයකු හැටියට හැඟෙන අයදුම්කරුවක් විසින් තමන්ගේ පත්වීමෙන් පසු අවුරුදු 5 ක කාලයක් ඇතුළත ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ප්‍රවීණතාවයක් ලබාගත යුතුවේ.

ඊ. ඞී. වික්‍රමනායක,
ඇටෝර්නි ජනරාල් වෙනුවට.

ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුව,
අළුත් කඩේ,
කොළඹ 12.

## ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය

### පෙරකදෝරු ලිපිකාර තනතුරු

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :—
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :——— ———.
   (ආ) සෙසු නම් :—————.
2. ලිපිනය :—————.
3. වයස සහ උපන් දිනය :—————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය)
4. ලාංකිකයකු වනුයේ පරම්පරාවෙන්ද ? ලියාපදිංචි කිරීමෙන්ද ? : —————.
5. අධ්‍යාපනික සුදුසුකම් :—————.
6. පළපුරුද්ද :—————.
7. දැනට රක්ෂාවක් කරන්නේ නම් විස්තර :—————.

මේ අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ තෝරා ගැනීමට පෙර දැනගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

2–813—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## තක්සේරු දෙපාර්තමේන්තුව

### I වැනි ශ්‍රේණියේ තක්සේරු පරීක්ෂක තනතුරු

තක්සේරු දෙපාර්තමේන්තුවේ I වැනි ශ්‍රෙණියේ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් අයදුම් පත් ඉල්ලුම්කරුගේම අත් අකුරින් පුරවා, 1964.3.14 දින හෝ ඊට පෙර හෝ කොළඹ 7, අංක 5 සහ 7 ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙසේ ප්‍රධාන තක්සේරුකරුට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

**සැළකිය යුතුයි.**—ඉල්ලුම් පත් එවන කවරයේ ඉහළ වම් කෙළවර "පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්" යන්න සඳහන් කළ යුතුයි.

2. **පඩිය.**—මෙම තනතුරට අදාල වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 2,820න් ආරම්භ වී රු. 120 සේ වැඩිවීම් 9කින් හා රු. 180 වේ වැඩිවීම් 8කින් රු. 5,340 ඝ දක්වා නගී. රු. 4,080 වේ වාර්ෂික වැටුපට පෙර කාර්යක්‍ෂමතා කඩඉමක් ඇත.

තෝරා ගත් අයදුම්කරුවන් කාර්යක්‍ෂමතා කඩඉම ඉක්මවා උසස් කිරීමට පෙර නියමිත පරීක්‍ෂණයන්ගෙන් සමත් විය යුතුය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වනවා ඇත. ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කළයුතුවාක් මෙන්ම, අවශ්‍ය සියලුම රාජකාරි ගමන්ද කළයුතුයි. මුදල් රෙගුලාසි අනුව ගමන් වියදම් ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) සෑම අයදුම්කරුවෙක්ම 1964 මාර්තු 14 වැනි දිනට අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව සනාථ කිරීමට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළයුතුයි.

(ii) අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඊට සමාන හෝ උසස් අන් විභාගයකින් ගණිතය විෂයයක් ලෙස ඇතිව සාමාර්ථ්‍යය ලබා සිටිය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් වලින් එකක්ද ලබා සිටිය යුතුයි :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයයක මධ්‍යම පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය හෝ,

(ආ) අධිකාර පත්‍ර ලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයෙහි ප්‍රථම පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය හෝ,

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයයේ තක්සේරු පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨම්මාලාව සතුටුදායක ලෙස අවසන් කර තිබීම.

**මීට අතිරේකව.**—

තක්සේරු කටයුතු සම්බන්ධයෙන් අඩුම වශයෙන් සතර අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුයි.

5. ඉහත 4 වැනි ඡේදයේ අවශ්‍ය සුදුසුකම් තිබේනම් වයස සීමාව ගැන නොසලකා තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරීන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

6. අයදුම්කරුවන් ඉල්ලුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුයි :—

(අ) සුදුසුකම්, චරිතය සහ පත්වීම ලැබීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබා ඇති සහතික තුනක්,

(ආ) ගණිතයෙන් සමත්වී ඇති බව දැක්වෙන ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් පරීක්ෂණයක සහතික පත්‍රය සහ ලබාගෙන ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය. (අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ (උසස් පෙළින්) සමත්වී සිටිනා අයදුම්කරුවන් ඔවුන් උපාධි පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුස්සන් වීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට ලේඛන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.)

(ඇ) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කර ඇති විශේෂ සහතිකය (එය තිබේනම්.)

**සැළකිය යුතුයි.**—පසු දිනයක ඉල්ලා සිටි අවස්ථාවක අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය හෝ වයස පිළිබඳ විශේෂ සහතිකය හෝ ඉදිරිපත් කළයුතුය.

7. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්, 109 වැනි පාලන රෙගුලාසියට අනුව තම ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතුය. ප්‍රමාද වී ලැබෙන මෙවැනි ඉල්ලුම් පත් නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබුණ බව දන්වා ප්‍රමාදය සම්බන්ධයෙන් පිළිගත හැකි කරුණු දක්වා ඒවා භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කළහොත් මිස, භාරගනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වන ඡේදයේ මුළ පළ වන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි බලනු මැනවි.

ප. හ. වික්‍රමසිංහ,
ප්‍රධාන තක්සේරුකරු.

තක්සේරු දෙපාර්තමේන්තුව,
අංක 5 සහ 7, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 7, 1964 පෙබරවාරි 21 දින.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### තක්සේරු දෙපාර්තමේන්තුවේ I වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රයයි

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :—————.
2. ලිපිනය :—————.
3. (අ) වයස :—————.
   (ආ) උපන් දිනය :—————.
4. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :—————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :—————
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :—————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :—————.
5. ලාංකිකත්වය පරම්පරාවෙන්ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග : —————.
6. විවාහකද ? අවිවාහකද යන වග :—————.
7. අධ්‍යාපනික සුදුසුකම් සහ අවසානයට සමර්ථ වූ විභාගය විෂයයන් සමග :—————.
8. ජාතික භාෂාව කථා කිරීමට සහ ලිවීමට ඇති හැකියාව :—————.

9. අධ්‍යාපනය ලැබූ පාඨශාලා සහ විද්‍යාල, ඒවාට ඇතුළත්වූ සහ අස් වූ දිනයන්, සමර්ථවූ විභාග සහ විෂයයන්, සමර්ථ වූ දිනය යන්, ලබා ගන්නා ලද තෑගි ශිෂ්‍යත්ව සහ දීමනා :————:

10. පාසලේ හෝ විද්‍යාලයේ දී කළ ක්‍රීඩා හා විෂය මාලාවෙන් බාහිරව කළ කටයුතු පිළිබඳ විස්තර :————.

11. පාසලෙන් අස්වූ දින සිට කළ රැකියාවන් ගැන සම්පූර්ණ විස්තර සහ වකවානු :————.

12. තක්සේරු කටයුතු පිළිබඳව ලබා ඇති ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

13. චරිත සහතික ලැබී ඇති අයගේ නම් සහ නිලතල :————. (පිටපත් පමණක් ඉදිරිපත් කරන්න.)

14. තිබේනම් යුද්ධ සේවය පිළිබඳ තොරතුරු :————.

15. ණය ගැතිකම හෝ වෙනත් මුදල් පිළිබඳ කරදරවලින් නිදහස්ද යන වග :————.

16. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සැබෑ බවද, නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. යම් හෙයකින් මෙහි දක්වා ඇති විස්තර අසත්‍ය බව හෝ වැරදිබව හෝ දැනගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට පෙර නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–851—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 2 වන ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරු

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා අධ්‍යාපන ශාඛාවේ දෙවන ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරු තුනකට ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වන ආකෘති පත්‍රයේ පිළියෙල කළ යුතු, ඉල්ලුම්පත්, කොළඹ, තැ. පෙ. 509, වනසංරක්ෂක වෙත 1964 මාර්තු මස 20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**2. වැටුප් ක්‍රමය :** වර්ෂයට රු. 1,860—16 × 120—රු. 3,780 කි. (රු. 3,080ට පෙර කාර්යක්ෂමතා කඩඉම සමගය).

**3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :** තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ උපලේඛණයට තනතුර ඇතුලු කරනු ලැබුවහොත් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවෙක්ම—

(අ) 1964 මාර්තු මස 20 වැනි දිනට වයස අවුරුදු 20ට නොඅඩු 25ට නොවැඩි බවද (අන් අයුරින් සුදුසුකම් ඇති රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් වෙනුවෙන් මේ වයස් සීමාවන් බල නොපායි).

(ආ) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන උසස් විභාගයක් උසස් ගණිතය හා භෞතික විද්‍යාව සමග සමර්ථවී ඇති බව (ව්‍යවහාරික ගණිතයෙන් හා රසායන විද්‍යාවෙන් සමත්වී ඇත්නම් විශේෂයෙන් සලකා බලනු ඇත.) හෝ උසස් ගණිතය හා භෞතික විද්‍යාව ඇතුලුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් විෂයයන් හයකින් සමර්ථ වී ඇති බව හා ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතික පත්‍රය (විද්‍යුත හා යාන්ත්‍රික) හෝ (සිවිල්) දරන බවද

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බවද සතුටුදායක ලෙස ඔප්පු කළ යුතුය.

5. අයදුම් කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛනවල පිට පත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම් පත් වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බෞතිස්ම සහතිකය හෝ උප කෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කළ සහතික පත් බාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනට මත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතික පත් අනවශ්‍යය).

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති, රජයේ සේවයේ පත්වීම්වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම් ඒවා වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

වන සංරක්ෂක.

1964 පෙබරවාරි මස 20 දා,
කොළඹ 2,
තැ: පෙ. 509, වන සංරක්ෂකගේ කාර්යාලයේදී ය.

### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———— .
2. ලිපිනය :————.
3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද ලියා පදිංචිකිරීමෙන්ද යන වග :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) 64.3.20 වන දිනට වයස : අවුරුදු :————. මාස :————.
5. දැනට තනතුරක් දරන්නේ නම් ඒ කුමක්ද :————.
6. උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
7. කලින් රැකියාවන්හි යෙදී සිටියේ නම් විස්තර :————
8. විශෙෂ සුදුසුකම් ඇත්නම් ඒවා දක්වන්න :————.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–784—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## නැගෙණහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

### තත්ත්ව පාලක සහකාරවරුන්

**අවශ්‍ය සුදුසුකම්.**—රසායන විද්‍යාව සහ උද්භිද විද්‍යාව/ජීව විද්‍යාව/ගණිතය යන විෂයයන්ගෙන් එකක් සමග උසස් පාඨශාලා සහතිකය හෝ ලංඩන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙල) සහතිකය.

රසායනාගාරයක අඩු වශයෙන් අවුරුදු 2 ක පලපුරුද්දක් සහිතව රසායන විද්‍යාව සහ උද්භිද විද්‍යාව/ජීව විද්‍යාව/ගණිතය යන විෂයයන් එකකින් සම්මාන සාමාර්ථය ඇතුලුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

**වේතනය.**—මෙම තනතුරට අදල පඩි ක්‍රමය අවුරුද්දකට :

රුපි. 1,860/– — රුපි. 3,780/–

16 × 120

තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ගේ පරික්ෂණ/අත්හදබැලීම කාලය අවුරුදු තුනක් වේ. රජයේ භාෂා ප්‍රතිපත්තියට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත් ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සකස් කර ඇති නීතියේ හෝ මින් පසුව පිළියෙල කරන නීතිවලට හෝ අනුකූලව ඔවුන් ක්‍රියාකළ යුතුවේ.

තෝරාගනු ලබන අපේක්ෂකයින් වාලච්චනේ හෝ කොළඹ නැවතී වැඩ කිරීම අවශ්‍ය වේ.

අමතර දීමනාවන් සංයුක්ත මණ්ඩලයේ ගණන් අනුව ගෙවන අතර එකී දීමනාවන් දැනට රජය විසින් ගෙවනු ලබන ප්‍රමාණයන්ම වේ.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම මගින් ඉල්ලුම්කරුවන්ගේ අත්අකුරින්ම 1964 මාර්තු 15 වැනිද හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනය ඇතිව සභාපතිවරයා නමට ලැබෙනසේ ඉල්ලුම් පත් එවිය යුතුයි. ඉල්ලුම් පත් පෝර්ම තැපෑලෙන් ඉල්ලා එවන විට මුද්දර ගැසූ, සිය ලිපිනය සහිත කවරයක්ද එවිය යුතුයි.

සභාපති,
නැගෙණහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ.පෙ. 1367,
කොළඹ 1,
1964.2.24.

2–945—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

අංකය : ශිෂ්‍ය/408.

## අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශය

### 1965 මලයානු පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ 1965 මැයි මස සිට මලයාවේ ඉගෙනීම සඳහා ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

අධ්‍යයන විෂයයන් පිළිබඳව සීමාවක් නැත. එහෙත් ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ පශ්චාත් උපාධියක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් හෝ වෙනත් එවැනි සහතිකයක් ලබාගත හැකි පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා පමණ ය.

ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුහිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලෙඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලෙඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 23 වැනි කොටුවේ සහතික ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණ ය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණ ය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් 1965 මැයි මස සිට අවුරුදු දෙකක් වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ මලයානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ආ) 1965.1.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ඉ) රජයේ සේවකයෙක් නම්, 8 වැනි ප්‍රමාණයේ මට්ටමට සිංහල දැනීමක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ හැකි විය යුතු යි.

(ඊ) ඉගෙනීමට අදහස් කරන විෂයයට අදාල විෂයයන් සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතුය.

(උ) අදහස් කරන විෂයයෙහි පශ්චාත් උපාධි අධ්‍යාපනය ආරම්භ කිරීමට ප්‍රමාණවත් අවශ්‍ය මූලික සුදුසුකම් ලබා සිටිය යුතුය.

(ඌ) මලයාවේ පාඨමාලාවක් අනුගමනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබීමට තරම් ප්‍රමාණවත්, ඉංග්‍රීසි පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපෙක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ සථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 12(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතු ය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) මලයානු අධිකාරීන් විසින් පිළියෙල කරනු ලබන පරිදි, මලයාව බලා යාමේ සහ ආපසු පැමිණීමේ සංචාරක පන්තියේ ගුවන් ගමන් පහසුකම්.

(ආ) අනුමත කළ ඉගැන්වීම් ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු.

(ඉ) කොටස් වශයෙන් මාස්පතා ගෙවනු ලබන, මලයානු ඩොලර් 5,400 ක වාර්ෂික යැපීම් දීමනාවක්.

(ඊ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට මලයානු ඩොලර් 150 ක දීමනාවක්.

(උ) මලයාව ඇතුළත අනුමත කළ ගමන් සඳහා වර්ෂයකට මලයානු ඩොලර් 200 දක්වා දීමනාවක්.

(ඌ) සිය භාර්යාව කැටුව යන විවාහක ශිෂ්‍යත්වධාරීන් වෙනුවෙන්, වර්ෂයකට මලයානු ඩොලර් 1,200 ක අතිරේක විවාහ දීමනාවක් හා මලයාවට යාම හා ආපසු පැමිණීම පිළිබඳ භාර්යාවගේ ගමන් ගාස්තු. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන අවස්ථාවේ ශිෂ්‍යත්වධාරියා විවාහකව සිටියා නම් මිස, නැතිනම් මෙම දීමනාව මුල්, වර්ෂය තුළදී නොගෙවනු ලැබේ. භාර්යාව ද, ශිෂ්‍යත්වයක් දරන්නී නම් හෝ මලයාවේදී, වැටුප් ලබන රක්ෂාවක යෙදී සිටින්නී නම් හෝ මේම දීමනාව නොගෙවනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් මලයාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් මලයාවේ අධ්‍යාපන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශෙෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු යි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන්, ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම් කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකාබලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම. ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නො කෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

**14.** මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශෙෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1964.3.31 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 3. "සිරිමතිපායේ", අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**15.** රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි.

**16.** සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතු ය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1964 පෙබරවාරි මස 20 වැනිදා,
කොළඹ 3, "සිරිමතිපායේ"
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

2–836—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ. 324/එක්ස්. 1466/63.

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### රසායනඥ හා ශාඛාණු විද්‍යාඥ තනතුර

ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ රසායනඥ හා ශාඛාණු විද්‍යාඥ තනතුරක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට අයදුම් පත් :—1964 මාර්තු මස 13 වනදා

(බී) විදේශීය අයදුම් පත් :—1964 මාර්තු මස 20 වනදා

සටහන් (i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නව හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. වැටුප් සහ දීමනා.**—වර්‍ෂයකට රු. 4,080—12×360 10×480—රු. 13,200 ක වැටුප් ක්‍රමයක් මෙම තනතුරට හිමිවේ. (රු. 8,400ට සහ රු. 11,760ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් ඇති අතර, රු. 11,280 දී දෙවසක් යන තුරු වැටුප් වර්ධක ලැබෙන්නේ නැත.) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා, නියම කරනු ලබන පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබා නොගතහොත් වර්ෂයකට රු. 8,400 ඉක්මවීමට නුසුදුසු වේ.

**3. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර වුවද, විශ්‍රාම වැටුප් රහිත එකකි. සාර්ථක අයදුම්කරුවූන් අවුරුද්දක සෝදිසි කාලයකට භාජනය කරනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1964 මාර්තු මස 13 වැනි දිනට අවුරුදු 35 නොඉක්මවා ඇති බව, දැනට රජයේ ස්ථිර තනතුරු දරන්නන්ගේ වයස සීමාව නොසලකා ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

(ඇ) රසායන විද්‍යාව සම්බන්ධ පිළිගත් විශ්ව විද්‍යාලයට ප්‍රථම හෝ දෙවන පංතියේ ගෞරව සහිත උපාධියක් ලත් අයෙකු බව

සටහන : පර්යේෂණ හෝ පශ්චාත් උපාධි වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජන සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම කරන ලද සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.,

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඉ) සිංහල සහ/හෝ දෙමළ විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතික.

සැ. යු. : (1) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(2) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලැබුණු බවත්, ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයැයි නිර්දේශ නොකරතහොත් සලකා බලනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

8. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුයි.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුලත තම අයදුම් පත ලැබුනු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙත්නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 පෙබරවාරි මස 24 වැනි දින,
ගාළු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500—කොළඹ 1.

2–947—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රෙෂ්ඨාධිකරණය

### ශ්‍රෙෂ්ඨාධිකරණයේ ලඝු ලේඛක සේවාවේ ඉහළ ශ්‍රෙණියට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය

ශ්‍රෙෂ්ඨාධිකරණයේ ලඝු ලේඛක සේවාවේ ඉහළ ශ්‍රෙණියට ඇතුළත් වීමට කැමති පිරිමි අපෙක්ෂකයින් සඳහා තරඟ විභාගයක් 1964 අප්‍රේල් මස 6 වනදා හෝ ඊට පෙර ශ්‍රෙෂ්ඨාධිකරණයේ රෙජිස්ට්රාර් තැන විසින් කොළඹදී පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අපෙක්ෂකයින් වෙත, විභාගය පවත්වන නියම දිනය, වේලාව සහ ස්ථානය දැනුම් දෙනවා ඇත.

2. **වැටුප් ක්‍රමය.**—රුපියල් 3,300 න් පටන් ගෙන රුපියල් 120 සේ වාර්ෂික වැඩිවීම් 5 කින් ද, රුපියල් 180 වේ වාර්ෂික වැඩිවීම් 8 කින් ද වර්ෂයකට රුපියල් 5,340 දක්වා වැඩි වන වැටුපක් මෙම තනතුරු වලට හිමි වේ. වාර්ෂික වැටුප රුපියල් 3,900 වන්නට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති.**—මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිත වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට සහභාගි විය යුතුය.

4. **සේවා කොන්දේසි.**—(අ) තෝරාගනු ලබන අපෙක්ෂකයින්, තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

(ආ) විශේෂ දීමනා සහ අනෙකුත් සේවා කොන්දේසි දැනගැනීම සඳහා මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II ඡේදයේ මුල පළවන රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් වලට අදාළ පොදු කොන්දේසි බලනු මැනවි.

5. **සුදුසුකම්—සාමාන්‍ය කොන්දේසි—**

i. අපේක්ෂකයින් යහපත් චරිතයෙන් යුක්ත විය යුතුයි.

ii. අපේක්ෂකයින් ශ්‍රෙෂ්ඨාධිකරණයේ ලඝු ලේඛක සේවාවේ පහළ ශ්‍රෙණියේ අවුරුදු දෙකක් හෝ ඊට වැඩි කාලයක් සතුටුදායක ලෙස සේවය කළ අය විය යුතු හෝ අපේක්ෂකයින්ට යටත් පිරිසෙයින් පහත දැක්වෙන සහතික පත්‍රයන්ගෙන් එකක්වත් තිබිය යුතුය :—

(අ) ලන්ඩන් මැට්රිකියුලේෂන් හෝ කේම්බ්‍රිජ් සීනියර් සහතිකය, හෝ ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ ගෘහකර්ම විද්‍යා සහතිකය හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන වාණිජ සහතිකය හෝ

(ඈ) කේම්බ්‍රිජ් ජූනියර් සහතික පත්‍රය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද පාඨශාලාවකින් ප්‍රදානය කරන ලද කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඇතුළුව පහත සඳහන් සහතිකයන්ගෙන් එකක් :—

(i) ලන්ඩන් වෙළඳ මණ්ඩලය මගින් ලංකා පරිපාටිය යටතේ ප්‍රදානය කරනු ලබන වාණිජ අධ්‍යාපන (සාමාන්‍ය වාණිජ හෝ ලඝු ලේඛක ටයිප් කරුවන්ගේ අංශය) සහතිකය.

(ii) ලංකා වෙළඳ මණ්ඩලය සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ප්‍රදානය කරනු ලබන වාණිජ අධ්‍යාපන (සාමාන්‍ය වාණිජ හෝ ලඝු ලේඛක ටයිප් කරුවන්ගේ අංශය) සහතිකය නැතහොත් උසස් වාණිජ අධ්‍යාපන (සාමාන්‍ය වාණිජ සහ ලඝු ලේඛක ටයිප් කරුවන්ගේ අංශය) සහතිකය.

(iii) ගණන් තබන්නන් හා ලඝු ලේඛක ටයිප් ගසන්නන් සඳහා වූ ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ සහතිකයේ උසස් වාණිජ සහතිකය.

iii. 1964 මාර්තු 16 වැනි දින වන විට අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 17 ට නොඅඩුව හා අවුරුදු 40 ට නොවැඩිව තිබිය යුතුය.

iv. අපේක්ෂකයා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයකු වන විටදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් හෝ සිංහල භාෂා විෂයයෙන් නැතහොත් ඊට සමාන වෙනත් විෂයයකින් සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුයි.

(1961 ජනවාරි 1 දිනට පෙර දිනක සිට රජයේ සේවයේ නියුක්තව සිටි, රජයේ සේවයේ වෙනත් තනතුරුවලට පත්වීමට අපෙක්ෂා කරන නිළධාරීන්ට මෙම අවශ්‍යතාවය අදාළ නොවනු ඇත.)

**සැලකිය යුතුයි.**—(i) ස්ථානයෙන් ස්ථානයට මාරු කළ හැකි රජයේ ලඝු ලේඛක සේවාවට අයත් ස්ථිර තනතුරු දරණ නිළධාරීන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන විසින් එම නිළධාරීන් තෝරාගනු ලැබුවහොත් ශ්‍රෙෂ්ඨාධිකරණයේ ලඝු ලේඛක සේවාවට පත් කිරීම සඳහා නිදහස් කිරීමට එකඟව සහතික කළහොත් පමණය.

(ii) ඉහත සඳහන් විභාගවලට පෙනී සිටි එහෙත්, ඉල්ලුම් පත් භාරගන්නා දිනයට පෙර එම විභාගවල ප්‍රතිඵල පිට නොවූ අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

6. **සුදුසුකම්.**—රජයේ සේවකයින්ට ඇති විශේෂ සහන—රජයේ ස්ථිර තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් ඇතොත් 5 වෙනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව, මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) ස්ථානයෙන් ස්ථානයට මාරු කළ හැකි රජයේ ලඝු ලේඛක සේවාවේ පහළ ශ්‍රෙණියේ අවුරුදු 4 ක සතුටුදායක සේවයක් සහ,

(ආ) 1964 මාර්තු 16 වන දින වන විට වයස අවුරුදු 45 ට අඩුව තිබීම.

7. **අයදුම්පත්.**—(i) අයදුම්පත්, කොළඹ-12, ශ්‍රෙෂ්ඨාධිකරණයේ රෙජිස්ට්රාර් තැන වෙත 1964 මාර්තු 16 වැනිදා දවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) නියමානුකූලව අවලංගු කළ රුපියල් 15 ක මුද්දර අයදුම් පතෙහි අලවා තිබිය යුතුය.

8. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) සෑම අයදුම් කරුවෙක්ම ඉල්ලුම් පත්‍රය සමග මෑතදී ලබාගන්නා ලද චරිත සහතික දෙකක පිටපත් එවිය යුතුය. මෙයින් එකක් අයදුම්කරු අන්තිමට ඉගෙන ගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතුය.

(ii) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකයේ පිටපත.

**සැලකිය යුතුයි.**—බෞතිස්ම සහතික හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාර ගනු නොලැබේ.

(iii) සාමාර්ථය ලැබූ උසස්ම විභාගයේ සහතිකයේ පිටපත.

9. **විභාග පරිපාටිය.**—දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පරීක්ෂණය මෙසේ ය :

(අ) ලඝු ලේඛන වේග පරීක්ෂණයක්—මෙහිදී නීතිය සම්බන්ධ පාඨ මිනිත්තුවකට වචන 140 ක වේගයෙන් මිනිත්තු 8 ක් තුළ කියවනු ලැබේ. කියවනු ලැබූ පාඨ කියවා අවසන් වූ ඉක්මණින්ම මිනිත්තු 48 ක් ඇතුළත ටයිප් ගැසිය යුතුය.

(ආ) යථෝක්ත පරීක්ෂණයෙන් සමර්ථවන අයදුම්කරුවන් අපරාධ නඩු විභාගයක සාක්ෂි මිනිත්තු 15 ක් තුළ සටහන් කර ගැනීමේ තවත් පරීක්ෂණයකට භාජන කරනු ලැබේ. ඊට පසු ඔවුන් සටහන් කරගත් දේ නියමිත කාලයක් තුළදී ටයිප් ගැසීම කළ යුතු වෙයි.

(ඉ) යථෝක්ත පරීක්ෂණයෙන් සමර්ථවන අපේක්ෂකයින් ඊට පසු තුන්වන පරීක්ෂණයකට භාජන කරනු ඇත. එය අපරාධ අධිකරණයක අපරාධ නඩු විභාගයකදී මිනිත්තු 15 ක් තුළ විනිශ්චයකාරතුමෙකුගේ සාක්ෂි සම්පිණ්ඩනය ලියා ගැනීම සහ ලියා ගත් දේ නියමිත කාලයක් තුළදී සාමාන්‍ය විධියට ලිවීම.

10. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි දැන ගැනීම පිණිස පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමාර්ථ්‍යය ලැබිය යුතුයි.

11. මෙම ව්‍යවස්ථාවල කියැවී නැති යම් කරුණක් වුවහොත් ඒ ගැන ශ්‍රෙෂ්ඨාධිකරණයේ රෙජිස්ට්රාර් තැනට සුදුසුය යි වැටහෙන පරිදි ක්‍රියා කරනවා ඇත.

නා. නවරත්නම්,
ශ්‍රෙෂ්ඨාධිකරණයේ රෙජිස්ට්රාර් (වැඩ බලන).

1964 පෙබරවාරි 24 දින,
ශ්‍රෙෂ්ඨාධිකරණ කාර්යාලය,
කොළඹ-12.

### ආදර්ශ අයදුම් පත

**ශ්‍රෙෂ්ඨාධිකරණයේ ලඝු ලේඛක සේවාවේ ඉහළ ශ්‍රෙණියට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනෙක් නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. කාර්‍යාලයීය ලිපිනය :————.
4. උපන් දිනය සහ 1964 මාර්තු 16 වන දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
5. ජාතිය :————.
6. ඔබ ලාංකිකයෙක් වන්නේ—
   පෙළපතින් ද :————.
   නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද යන වග :————.
7. සමත් වූ උසස්ම විභාගය—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
8. රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්— මාරුවීම් සහිත පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛක සේවයේ සේවා කාලය :————.
9. මෙහි අමුණා ඇති චරිත සහතික පත් ලබාගත් අයවලුන්ගේ නම් සහ ලිපිනයන්—
   1. :————.
   2. :————.

මේ අයදුම් පතෙහි මා විසින් දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

> රුපියල් 15 ක් වටිනා මුද්දර මෙහි අලවා අය දුම්කරු විසින් ඒවා අව ලංගු කළ යුතුය.

දිනය :————.

————————,
අයදුම්කරුගේ අත්සන.

2–919—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/35/1(ජී).

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත නම් සඳහන් සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ පළමුවන ශ්‍රෙණියේ නිලධාරීන් එම සේවයේ විශේෂ ශ්‍රෙණියට උසස් කිරීම සඳහා තෝරා ගෙන ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ස. අරුමයිනායගම් ... | ... ඔඩිටර් ජනරාල් |
| ගේ. ඥ. එලියතම්බි ... | ... වෙළඳ සමාගම් |
| ත. ඉ. කමල්ඩීන් ... | ... කච්චේරිය, බදුල්ල |
| ආ. සි. කුමාරසිංහ ... | ... ධීවර |
| ගො. කොඩිතුවක්කු ... | ... නියෝජ්‍ය පිස්කල් කාර්‍යාලය, කෑගල්ල |
| මු. රා. ගණපති ... | ... මැතිවරණ |
| එ. වි. හ. ගුණසේකර ... | ... වාරිමාර්ග |
| නා. ජේ. ජයසිංහ ... | ... දේශීය ආදායම් |
| පො. ආ. ඩයස් ... | ... නියෝජ්‍ය පිස්කල් කාර්‍යාලය, කළුතර |
| දෙ. ඩැන්ෆිත් ... | ... රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| ඇ. ටො. අ. ඩිරෙක්ස් | ... අධ්‍යාපන |
| බ. පා. අ. තම්බිනායගම් | ... මහා භාණ්ඩාගාරය |
| ඉ. සි. තම්බිමුත්තු ... | ... තක්සේරු |
| පැ. කො. අ. ආ. ද අල්විස් | ... රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථ සාධක සමාගම |
| පී. ලි. න. ද සිල්වා ... | ... මහා භාණ්ඩාගාරය |
| පු. හෙ. පී. ද සිල්වා ... | ... වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය |
| ත. දුරෙයිරත්නම් ... | ... මැතිවරණ |
| සෙ. නඩරාජා ... | ... කච්චේරිය, කොළඹ |
| සී. නාගලිංගම් ... | ... කච්චේරිය, කොළඹ |
| ස. ජලම්රිජ් ... | ... කච්චේරිය, මාතලේ |
| ක්ලෙ. වි. පරණවිතාන | ... මහා භාණ්ඩාගාරය |
| දෙ. ගු. පල්ලියගුරු ... | ... අධ්‍යාපන |
| සී. පීටර්ස් ... | ... මහා භාණ්ඩාගාරය |
| ජේ. වී. ඔ. ජේ. පීරිස් ... | ... දිස්ත්‍රික් උසාවිය, කළුතර |
| රො. වි. පීරිස් ... | ... දිස්ත්‍රික් උසාවිය, ගම්පහ |
| ලො. හ. පීරිස් ... | ... මහා භාණ්ඩාගාරය |
| අ. ගු. ප්‍රැ. පෙරේරා ... | ... මහා භාණ්ඩාගාරය |
| ම. එ. බ. පෙරේරා ... | ... රජයේ වැඩ |
| ම. නි. පෙරේරා ... | ... සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය |
| ස. ප්‍රැ. ජෝ. පෙරේරා | ... මහා භාණ්ඩාගාරය |
| දෙ. පි. පොන්නම්පෙරුම | ... අධ්‍යාපන |
| බැ. මුණසිංහ ... | ... ඔඩිටර් ජනරාල් |
| ර. සි. ද. සි. මුණසිංහ ... | ... වෙළඳ සමාගම් |
| බැ. ග්ලැ. හෙ. මෙන්ඩිස් | ... මහා භාණ්ඩාගාරය |
| ක. රසාක් ... | ... කච්චේරිය, ත්‍රිකුණාමලේ |
| හෙ. දෙ. රිගොබට් ... | ... අධ්‍යාපන |
| දෙ. ග්‍රි. වර්ණකුල ... | ... කච්චේරිය, කළුතර |
| සි. දෙ. විල්ප්‍රඩ් ... | ... පිස්කල් කාර්‍යාලය, කොළඹ |
| කු. පෙ. වීරසේකර ... | ... ගුවන් විදුලි හා ප්‍රවෘත්ති |
| නා. වේළුපිල්ලේසි ... | ... රජයේ ගබඩා |
| ඇ. ඉ. සන්තියාපිල්ලෙයි | ... ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත |
| ආ. සපබානායගම් ... | ... ජාතික නිවාස |
| සු. සංගරසිවම් ... | ... ගුරු වැ.අ.වි.වැ. අරමුදල් කාර්‍යාලය |
| කො. ආ. සිල්වා ... | ... පළාත් පාලන |
| චෙ. සිවසුන්දරම් ... | ... කම්කරු |
| සී. සුන්දරලින්ගම් ... | ... ජාතික නිවාස |
| මා. සුප්‍රමානියම් ... | ... මෝටර් රථ ගමනා ගමන |
| ෂ. ජු. සුලෙයිමන් ... | ... විදුලි කර්මාන්ත |
| ජී. ඩ. ජ. ගු. සෙනෙවිරත්න | ... අල්ලස් කොමිෂන් කාර්‍යාලය |
| අ. සෝමසුන්දරම් ... | ... කච්චේරිය, මන්නාරම |

කේ. එන්. වීරක්කොඩි,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවට ය.

1964 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

2–950—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

### ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1964**

ඉහත සඳහන් විභාගය සම්බන්ධව, අංක 13,950 හා 1964 පෙබරවාරි මස 14 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (ii) වැනි ඡෙදයේ පළ කරන ලද 1964 ජනවාරි 31 දින නිවේදනය පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ. එම නිවේදනයේ ii (v) යන ඡෙදය කපා හැර ඒ වෙනුවට පහත සඳහන් අළුත් ඡෙදය යොදන්න.

ii. (v) වාණිජ විද්‍යාව—(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පැ. 3ක ප්‍රශ්න පත්‍රයකි. ලකුණු 200 යි. වාණිජ පන්තියට ඇතුළුවීමට බලාපොරොත්තුවන අයදුම්කරුවන් සඳහා ය.

එච්. එල්. විමලසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

1964 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ 2, මලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

2–943—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

**වෘත්තීය අංශයේ සන්ධ්‍යා පන්තිවලට ශිෂ්‍යයන් බඳවා ගැනීම**

### 1964-65 අධ්‍යයන වර්ෂය

පහත සඳහන් වන වෘත්තීය අංශයේ සන්ධ්‍යා පන්තීවලට ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර මවිසින් භාරගනු ලැබේ :—

| | |
|---|---|
| 1. යන්ත්‍රගල් පුහුණුව | තුන් අවුරුදු |
| 2. ශේත්තු වැද්දීම | තුන් අවුරුදු |
| 3. වාත්තු මල් සෑදීම | තුන් අවුරුදු |
| 4. වඩු සටහන් ඇඳීම | තුන් අවුරුදු |
| 5. වර්ණ යෝජනාය පුහුණුව | තුන් අවුරුදු |
| 6. පොත් බැඳීම පුහුණුව | තුන් අවුරුදු |
| 7. විදුලි කම්බි සවි කිරීම | එක් අවුරුදු |
| 8. ජල නල සවි කිරීම සහ ජලප්‍රවාහණය | එක් අවුරුදු |
| 9. ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම | එක් අවුරුදු |

මෙම පන්තිවලට බඳවා ගනු ලබන්නේ ඒ ඒ වෘත්තියෙහි නියදී සිටින්නන් පමණකි.

ඉල්ලුම්පත්‍ර මෙම කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවා එවිය යුතුය. එක් අවුරුදු පන්ති සඳහා රුපියල් 1ක මුද්දරද, තුන් අවුරුදු පන්ති සඳහා රුපියල් 2ක මුද්දරද ඉල්ලුම්පත්‍රවලට අලවා ඒ මත ඉල්ලුම්කරුගේ අත්සන යෙදිය යුතුය.

**ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1964 මාර්තු මස 31 වැනිදා ය.**

ඉල්ලුම්පත්‍ර ආකෘති 1964.3.21 වැනි දින දක්වා නිකුත් කරනු ලබන්නේ තැපැල් මගින් පමණි. තැපැල් මගින් ඉල්ලුම්පත්‍ර ආකෘති ලබා ගැනීමට බලාපොරොත්තු වන අය තමාගේ ලිපිනය ලියන ලද මුද්දර නො ඇලවූ දිග ලියුම් කවරයක් එවිය යුතුය.

පැමිණ ලබා ගන්නා අයට ඉල්ලුම්පත්‍ර ආකෘති 1964 මාර්තු මස 23 වැනිදා සිට 1964 මාර්තු මස 30 වැනිදා දක්වා මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඉහත සඳහන් පන්ති පිළිබඳ වැඩිපුර විස්තර වෘත්තීය අංශයේ අත් පොතෙන් බලා ගත හැකිය. මෙම අත්පොත පැමිණ ලබා ගන්නා අයට පිටපතකට රු. 1 බැගින් ගෙවා කොළඹ, මහලේකම් කාර්යාලයයේ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් ලබාගත හැකිය. අත්පොත් තැපැලෙන් ලබා ගන්නා අයට පිටපතකට රු. 1.20 බැගින් මුදල්, පෝස්ටල් ඕඩර් මගින් කොළඹ, ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙත එවීමෙන් ලබාගත හැකිය.

නියමිත වටිනාකමට අඩුවෙන් මුද්දර ඇලවූ හෝ අසම්පූර්ණ හෝ වැරදි ලෙස පුරවන ලද හෝ ප්‍රමාද වී ලැබෙන හෝ සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කේ. ඇම්. ඩී. පෙරේරා,
වැඩබලන ලේඛකාධිකාරි.

1964 පෙබරවාරි මස 14 වැනිදින,
කොළඹ 10,
ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේදීය.

2–658—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා ප්‍රාදේශීය ප්‍රධානයන් වෙතය**

### රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ

මේ විභාගය 1964 මැයි 9 හා 16 වන දිනයන්හි පවත්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනය මාර්තු 20 වන දින වේ.

පසු ගිය විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන තුරු ඉල්ලුම් පත්‍ර නොඑවිය යුතුය.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1964 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

2–942—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

අංකය: 1/3/7 (ජී).

### 1962 සැප්තැම්බර් මස පැවැත්වුණු මධ්‍ය ලිපිකාර විභාගය

1963 දෙසැම්බර් 13 වැනි දින හා අංක 13,856 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 දෙසැම්බර් 9 වැනි දින දරණ නිවේදනයට වැඩිමනත් වශයෙනි.

1962 සැප්තැම්බර් මස පැවැත්වුණු මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියට පත් කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

| නම | | ලිපිනය |
|---|---|---|
| අප්පු සිඤ්ඤෝ, ග. බ. | ... | බෝපිටිය, පැල්මඩුල්ල |
| අබයසිරි, දේ. අ. | ... | ''ලලිත'', ඉත්තැපාන |
| අබයසුන්දර, කු. ග. | ... | ගාඩ් පරීක්ෂක කායර්‍යාලය, දුම්රියපළ, මරදන |
| අබේනායක, සු. | ... | හොරගොඩ, නෙලිජ්ජවිල |
| අබේසිංහ, ඩො. අ. | ... | නො. 90, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන දකුණ, ගල්කිස්ස |
| අබේපිටියගේ, ද. | ... | ඇඳීමේ අංශය, මිනින්දෝරු කායර්‍යාලය, කොළඹ |
| අභයවර්ධන, ජ.වි. | ... | අ/තලාව රජයේ බෞද්ධ විද්‍යාලය, තලාව |
| අමදෝරු, වෙ.ක.ජ. | ... | හාතාගල, හුංගම, තංගල්ල |
| අමරදාස, තෙ. ප. ගු. | ... | ආහාර පාලන අංශය, දිසාපති කායර්‍යාලය, පොළොන්නරුව |
| අමරසිංහ, නි. | ... | සේවක අර්ථසාධක අරමුදල් කායර්‍යාලය, තැ. පෙ. 1508, කොළඹ |
| අමරසේන, අ.ග. | ... | අමුවල, හංගමුව, රත්නපුර |
| අමරසේන, ඉ. ජේ. | ... | නො. 69, එළුවපිටිය, වේයන්ගොඩ |
| අමරසේන, දි. | ... | බටුවිට, ගෝනපල හන්දිය |
| අමරසේන, හ. වි. | ... | ගුරුවිදුහල් ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| අයිවන්, ප. දු. | ... | ගුරුබැවිල, මීදිගම නැගෙනහිර, වැලිගම |
| අරුලන්දම්, ඇ.ඉ. | ... | 35, කැත්‍රීඩල් පාර, යාපනය |
| අල්විස්, ව. නෙ. ම. | ... | සහකාර ආහාර පාලක තැනගේ කායර්‍යාලය, ලෝටස් පාර, කොළඹ 1 |
| අලහකෝන්, නී. බ. | ... | ඩී. බී. අලහකෝන් මහතා බාරේ, අම්පිටිය, මහනුවර |
| ආරියපාල, ගී. | ... | ''ගීතායණ'', කුඩාඋඩුව, හොරණ |
| ආරියරත්න, පො. ග. | ... | තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| ආරියරත්න, ලි.වි. | ... | බැලුම්මහර, ඉඹුල්ගොඩ |
| ආරියවංශ, හො. ආ. | ... | 137, පානදුර පාර, හොරණ |
| ආරියසේන, හෙ. | ... | වල්ගම්මුල්ල සමූපකාරය, පොතුහැර |
| ඇඩ්වින් සිඤ්ඤෝ, බැ. ව. | ... | අංක 119, ඔරුතොට, ගම්පහ |
| ඇන්තනිස්, ජ. ආ. | ... | ''ෆිලිඩ් විව්'', බලගහමුල, බලන්ගොඩ |
| ඉන්ද්‍රදාස, කො.මු. | ... | හ/කැඳල සිරි රෝහණ විද්‍යාලය, කැඳල, මොදරවාන |
| ඉරුතයරාසා, ජෝ. | ... | මුදල් අංශය, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ |
| උක්වත්තගේ, සු. | ... | සරප් අංශය, ප්‍රධාන තැපැල් කායර්‍යාලය, කොළඹ |
| උපසේන, වී. | ... | අංක 4341, ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, රත්මලාන |
| උපසේන, හෙ. ලි. | ... | කුරුඳුවත්ත, සුල්තානාගොඩ |
| උබයසේන, මා. | ... | පල්ලෙගම, කොළවෙනිගම |
| එඩ්මන්, ජ. ආ. | ... | ඇන්නපිටියගොඩ, තංගල්ල |
| එදිරිසිංහ, එ. මු. හේ. | ... | කොල්ලුර, පොල්ගහවෙල |
| එදිරිසිංහ, කු. ප. | ... | 372, මිරිහාන, නුගේගොඩ |
| එදුස්සූරිය, ර. ගු. | ... | රජයේ රෝහල, අවිස්සාවේල්ල |
| ඒකනායක බණ්ඩාර, ර.ආ.හේ මු. | | නො. 261, වරාගොඩ, කැළණිය |
| ඔදිරිස්හාමි, අ. ආ. | ... | කෝන්ගමුව, මාවනැල්ල |
| කන්තයියා, සී. | ... | මැතිවරණ කායර්‍යාලය, යාපනය |
| කන්තසාමි, වේ. | ... | සිවන්කෝවිල් පටුමාවත, අවරන්කල්, පුතූර් |
| කන්දයියා, ක. | ... | අවරංකාල, පුත්තූර් |
| කනගලින්ගම්, නා. | ... | උතුර අරලි, වඩ්ඩුකොඩ්ඩෙයි |
| කමලනාතන්, ම. | ... | 16/1, කෝනර් පාර, මුදිලියර් වීදිය, මඩකලපුව |
| කරුණාදාස, ක. | ... | අංක 30, ''රම්‍යාවාස'', මැලදූම්පොත, මාතලේ |
| කරුණාදාස, ව. මෙ. | ... | ''සී–සයිඩ්'', දෙඩන්දූව |
| කරුණානායක, ගු. | ... | සරසවි පිවිසුම් පෙළ, මහා විද්‍යාලය, මොරවක |

| නම | ලිපිනය |
|---|---|
| නවරත්න, න. මු. සු. බ. | පොලිස් ස්ථානය , කොළඹ 6 |
| නවාස්, මො. ර. | 81, ගොන්ගාවල පාර, මාතලේ |
| නාගමනි, පො. | 2 වැනි හරස් වීදිය, නායිනතිව් |
| නාගරාජා, සු. ... | නැගෙනහිර අල්ලයිපිඩ්ඩි,අල්ලයිපිඩ්ඩි, යාපනය |
| නාගේන්ද්‍රම්, ඉ. | අංකය 67, ඩී 8, උරුත්තිරපුරම් |
| නානායක්කාර, ගො. ලි. බ. | ''නන්දනී'', බැදිපිට, අහුළුගහ |
| නානායක්කාර, නා. ගු. | 11, ගංගොඩපාර, කුරුණෑගල |
| නානායක්කාර, සී. ඩ. දෙ. | හිඳගල, මහනුවර |
| නාමවර්ධන, වි. මෘ. | දවටව, නාරන්ගොඩ |
| නාරායනමූර්ති, රා. | ඇස්. රසයියා මහතා බාරේ, කුල්ල කඩ්ඩු, වතිරි, කරවෙඩ්ඩි |
| නිමලසේන, වී. | මල්වල හන්දිය, මල්වල |
| පතිරණ, ජේ. ... | මලව, කුරුවිට |
| පද්මසිරි, න. ම. | 31, නුවර පාර, පස්යාල |
| පරමසෝති, ආ. | මුල්ලයිප්පිලව්, කරයිනගර් |
| පරමේස්වරන්, අ. | ඉම්පීරිය මුද්‍රණාලය, 95 හා 96 මහවීදිය, හැටන් |
| පරරාජසේකරම්, න. | 241/31, කිරුළ පාර, කොළඹ 5 |
| පසුපතිප්පිල්ලෙයි, ක. | 61/4, ස්ටේස් පාර, කොළඹ 14 |
| පිංචි අප්පුහාමි, හ. මො. | නවගමුව, දේවාලේගම |
| පියදස, ඕ. ප. ... | කිවුල්ගොඩවත්ත, හීනටිගල, තල්පෙ |
| පියදස, උ. මු. රා. | උස්සාපිටිය |
| පියදස, කු. ක. | ග්‍රාම සේවක, මහවලතැන්න, බලංගොඩ |
| පියදස, මැ. ගෙ. | ''ශාන්ති'', පල්ලේපොල |
| පියදස, මැ. ලේ. | මීගහගොඩ, පැල්මඩුල්ල |
| පියදස, ර. දෙ. | පිළේකුඹුර, හබුරුගල |
| පියදස, සි. ප. ... | යායමුල්ල, වඩුමුන්නේගෙදර |
| පියසේන, ගු. මු. | ඕදුවිල, අම්බලන්තොට |
| පියසේන, නා. ප. | ''පියසෙවන'', වැකුණුගොඩ පාර, බෝපෙ, ගාල්ල |
| පියසේන, නි. ග. | 27/4, සුබෝධාරාම පාර, දෙහිවල |
| පියසේන, බි. ප. | ''කිම්සෙල් කොට්'', 13/3, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන |
| පියසේන, ව. අ. | බුත්තලගෙවත්ත, කදුරුපොකුණ, තංගල්ල |
| පියසේන, වී. ස. | නො. 19/1, කෝවිලවත්ත, ගාල්ල |
| පියසෝම, සි. දේ. | නො. 232, උඩහවීදිය, රක්වාන |
| පියසෝම, හ. ආ. | නු/හරිස්බැද්ද රජයේ විද්‍යාලය, හරස්බැද්ද, හල්ග්‍රන්ඔය |
| පීටර්, ගි. ... | නියාමක පරීක්ෂක බාරේ, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මරදාන |
| පීවර්, පු. ක. ... | උඩවැලිවිටිය, නාගොඩ |
| පීරිස්, ප. ල. ... | අංක 294/10, විජිත පාර, නිකපෙ, දෙහිවල |
| පුංචිබණ්ඩා, ඇ. රා. | ජයන්ති ස්ටෝර්ස්, වෙහෙරපිටි පාර, ගොඩවෙල, පොල්ගහවෙල |
| පුංචි බණ්ඩා, හෙ. | ''කන්දේ හේන'', ගල්පොල, මොලගොඩ |
| පුංචිනිලමේ, වි. මු. | ගන්නොරුව, මුරුතලාව |
| පෙරේරා, ක. ආ. වි. | ''මැණික නිවස'', පිළිකුත්තුව, බුත්පිටිය |
| පෙරේරා, කු. ජේ. ම. | ඇම්. ලියෝ පි. පෙරේරා මහතා බාරේ, බොරලැස්ස, ලුණුවිල |
| පෙරේරා, කො. ල. | නො. 99, ශ්‍රී වික්‍රම රාජසිංහ පාර, 4 වැනි කුරණ, මීගමුව |
| පෙරේරා, ග. ජෝ. ෆ්‍රැ. සා. | දූන්ගාල්පිටිය, තලාහේන, මීගමුව |
| පෙරේරා, ග. ල. | 1/35, කඩවත පාර, කළුබෝවිල, දෙහිවල |
| පෙරේරා, ත. ධ. | සමූපකාර වෙළඳසැල බාරේ, පනාවැන්න, කහවත්ත |
| පෙරේරා, පො. ආ. ඩී. | දෙමටගහවෙල, නාරම්මල |
| පෙරේරා, ම. ලෙ. බ. ම. | නො. 260, රේගුව පාර, බේරුවල |
| පෙරේරා, මැ. ර. | ''මිල් විව්'', ස්ටේෂන් පාර, සීදූව |
| පෙරේරා, ලො. ව. ගි. | වීදගම, බණ්ඩාරගම |
| පේරානන්තන්, ස. | 535, කන්කසන්තුරෙයි පාර, වාන්නාර පොන්නෙයි, යාපනය |
| පොඩිරාලහාමි, අ. මු. | ඉහළ උඩුපොල සමූපකාරය බාරේ, පොල්ගහවෙල |
| පොඩිසිඤ්ඤෝ, ප. දූ. | 20/19, ''සෙවන'', තිස්ස පුර, මල්වත්ත |
| පොන්නම්බලම්, ක. | නැගෙනහිර වූලිපුරම්, වූලිපුරම් |
| ප්‍රදිනාන්දිස්, සෝ. හ. | වේරදූව, මාතර |
| ප්‍රනාන්දු, ගා. ඇ. ප. ඇ. නෙ. | 40/7, ''ලිල්මා'', වොට්සන් පීරිස් මාවත, මොරටුව |
| ප්‍රනාන්දු, ප. ම. සි. නි. | ''ශ්‍රීයාවාස'', පිටිපන, මීගමුව |
| ප්‍රනාන්දු, ප. සි. ඩි. | නො. 673, කුරණ-කටුනායක, කටුනායක |
| ප්‍රනාන්දු, පි. ටි. | අංක 59, වල්පොල, බටුවත්ත |
| ප්‍රනාන්දු, ව. ජ. ගු. සෙ. ස. | ගබඩාඅංශය,මැනුම් දෙපාර්තමේන්තුව, කොළඹ |
| ප්‍රනාන්දු, සෙ. දි. | 2, ශ්‍රී චන්ද්‍රසේකර පාර, හොරේතුඩුව, මොරටුව |
| ප්‍රනාන්දු, හ. රේ. | දෙල්ගහවත්ත, වැකඩ, පානදූර |
| ප්‍රෙමිනාත්, කු. ලා. | පිටුම්පේ, පාදුක්ක |
| ප්‍රේමදස, ප. ගෙ. | දස්කර, ගෙලිඔය, ගම්පොළ |
| ප්‍රේමදස, බෙ. වි. | කෝරලේගොඩවත්ත, බේරගම, අගලවත්ත |
| ප්‍රේමදස, මු. මෙ. | පරෙයිගම, මතුගම |
| ප්‍රේමරත්න, දෙ. ආ. | රිලාවල, පොල්ගස්ඕවිට |
| ප්‍රේමරත්න, න. ආ. හේ. වැ. | පිල්ලවත්ත, නරවැල්පිට උතුර, හක්මන |
| ප්‍රේමරත්න, බෝ. | ඉඹුලෝවිට, තුන්තොට |
| ප්‍රේමරත්න, හි. | සිවිල්පාලක හා ගණකාධිකාරි කායර්‍යාලය, යුදහමුද මූලස්ථානය, කොළඹ |
| ෆර්ඩිනන්ඩ්, ෆ්‍රැ. ලෙ. | බ්ලොක් 4, අංකය 6, රජයේ නිවාස ක්‍රමය, කොස්වත්ත, නාවල පාර, රාජගිරිය |
| ෆිර්මිනුස්, ව. දෙ. න. වා. | ප්‍රසිද්ධ වෙළඳපොල අසල, ගාලු පාර, මග්ගොන. |
| බණ්ඩාරේ, මා. මු. | දිඹුල්කුඹුර, රිකිල්ලගස්කඩ |
| බන්දුතිලක, කු. හ. | ජාතික සේවා අංශය, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කොළඹ |
| බාලචන්දිරන්, සෙ. | දකුණු කර්නිකර, බටහිර වේලානෙයි, වේලානෙයි |
| බාලසුබ්‍රමනියම්, අ. | ''අන්නාවාස'', ඇන්. ඇම්. වීදිය, පේදුරුතුඩුව |
| බාලසුබ්‍රමනියම්, කි. | නැගෙනහිර උරුම්පරේ, උරුම්පරේ |
| බාලසුබ්‍රමනියම්, වෙ. | පෙරියකිලානයි, වියාපාරිමූලෙයි, පේදුරුතුඩුව |
| බාලසුබ්‍රමනියම්, වේ. | ගණන් අංශය, මානසික රෝහල, අංගොඩ |
| බාලසූරිය, බා. වි. ස. | ජී. ඇස්. බාලසූරිය මහතා බාරේ, දෙරටියාව, කුරුණෑගල |
| බැද්දේවෙල, සු. බ. | උඩ බැද්දේවල, බැද්දේවල |
| බියන්විල, පි. වි. | ර/දෙයියාගල විද්‍යාලයය, ගැටහැත්ත |
| බුලත්වත්ත, දි. මු. බු. ව. සෙ. බ. | බුලත්වත්ත වලව්ව, උඩුගොඩ, වත්තේගම |
| මක්බූල්, මො. අ. | 68, මුස්ලිම් විද්‍යාලය පාර, යාපනය. |
| මනම්පේරි, වි. | වැවහමන්දූව, මාතර. |
| මනුවෙල් අප්පුහාමි, ග. රා. | කුකුල්නාපෙ, පල්ලෙවෙල |
| මර්තේලිස් අපපුහාමි, අ. ආ. | හොරගස් අගාර, හිරුවල්පොල, මාදම්පේ |
| මරියලිනප්පන්, ම. | 8 වැනි කොට්ඨාශය, ඩෙල්ෆ්ට් සෙන්ටර්, ඩෙල්ෆ්ට් |
| මහාතේවන්, තු. | 12 සීනියර් පටුමග, කලට්ටි, නැගෙනහිර වන්නාර්පන්නයි, යාපනය |
| මහින්දරත්න, රා. මි. ප. | 338, කිරිල්ලවල, වැබඩ |
| මංචනායක, ම. මු. ක. | මැදගම, පණිරෙන්දව, මාදම්පේ |
| මායාදුන්නේ, ජේ. ඔ. ඩෙ. | ''කාස්ත්‍ර'', තලාහේන, මීගමුව |
| මාරසිංහ, මා.සු . සු. වි. | 150, මාලිගාතැන්න, කඩුගන්නාව |
| මාරිමුත්තු, ක. | නැගෙනහිර වට්ටුක්කෝට්ටයි, චිත්තංකේණි |
| මිත්‍රසේන, දෙ. ග. | ඉහළගෙවත්ත, දෙඩම්පෙ, තල්පේ |
| මුතුකුමාරු, ක. | කාලිකොවිල්ලඩි, නෙල්ලිඅඩී, කරවෙඩ්ඩි |
| මුතුක්‍රිෂ්ණන්, ම. | තම්බවෙට්ටි, බටහිර පුලෝලි, පේදුරුතුඩුව |
| මුතුබණ්ඩා, දි. මු. | අඹගස්වැව, බලල්ල |
| මුතුමාල, ප්‍ර. | දෙවිනුවර |
| මුතුලින්ගම්, අ. | මප්පාණපුර, උතුර කරෙයිනගාර්, කරෙයිනගාර් |
| මුදියන්සේ, කි. | කු/තම්මිට රජයේ විදුහල, උහුමීය |
| මුදියන්සේ, රා. අ. හේ. මු. | විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, කැළණිය |
| මුන්වීර, පි. | නො. 6, අත්තිඩිය පාර, ගල්කිස්ස |
| මෙන්ඩිස්, ති. ඩ. | ගොඩගෙදර, බලපිටිය |
| යවානිස් අප්පුහාමි, වි. ආ. | කුස්වල, කටුනායක |
| යසපාල, ක. ආ. | ''රම්‍යා'', අගලවත්ත |

| නම | | ලිපිනය |
|---|---|---|
| යෝගීස්වරන්, ස. | ... | කන්දෙරෙඩෙයි, චුන්නාකම් |
| රගුනාතන්, අ. | ... | කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලය, කුණ්ඩසාලේ |
| රගුනාතන්, වේ. | ... | දකුණු උරුම්පිරයි, උරුම්පිරයි |
| රණතුංග, ජ. ර. ආ. නි. | ... | ''තුංග නිවෙස'', යොන්ගම්මුල්ල, යක්කල |
| රණසිංහ, අ. | ... | නො. 63, අළුත්ගම, බණ්ඩාරගම |
| රණසිංහ, ජ. | ... | කනත්තේ වත්ත, අඳුරත් විල, පෝද්දල |
| රත්නතිලක බණ්ඩාර, චා. මු. | ... | වල්පල පිටිය, පූජාපිටිය |
| රත්නායක, අ. මු. | ... | කෙහෙල්වල, පේරාදෙනිය |
| රත්නායක, සෙ. | ... | නො. 75, නවයාලතැන්න, කටුගස්තොට |
| රම්‍යසිරි, බ. පේ. | ... | නො. 368ඒ, මාවතවත්ත, දඹල්ල, ගාල්ල |
| රංබණ්ඩා, වි. කෙ. මු. | ... | ග්‍රාමසේවක, පහලමලගනේ, හෙට්ටිපොල |
| රාජරත්නම්, අ. ම. | ... | 200, මහවීදිය, යාපනය |
| රාජරත්නම්, නා. | ... | කල්වයල්, චාවකච්චේරි |
| රාජරත්නම්, මු. | ... | මනිඅර්කඩු, බටහිර කොකුවිල්, කොකුවිල් |
| රාජරත්නම්, සි. | ... | කට්කෝවලම්, පේද්‍රුරුතුඩුව |
| රාමචන්ද්‍රන්, ක. | ... | නෙල්ලන්ඩෙයි, පේද්‍රුරුතුඩුව |
| රාමසිවම්, අ. | ... | 753, මන්ඩන්ඩාවෙල, මාතලේ |
| රාසතුරෙයි, පෙ. | ... | වී. එම්. පාර, පේද්‍රුරුතුඩුව |
| රාසනායගම්, ම. ජෝ. | ... | 199, වෙරළ පාර, පෂයියූර්, යාපනය |
| රිවෙල්, හෙ. ම. | ... | කුඩාමතුගම, පරෙයිගම |
| රුද්‍රාමූර්ති, ක. | ... | පෙත්කලන්තම්බයි, තෙලිප්පලෙයි |
| රූපසිංහ, ජා. ආ. | ... | තලල්ල උතුර, කැකණඳුර |
| රොමියෙල්, හි. පු. | ... | අංක 41, නූරිපාර, දූරණියගල |
| රොයිස්ටන්, උ. ජෝ. | ... | විවිධ සේවා සමූපකාරය බාරේ, කඳවල, කටාන |
| ලයනල්, කො. ග. | ... | නැගෙනහිර ගෝනාපිනුවල, ගෝනාපීනුවල |
| ලයනල්, ල. ආ. දෙ. | ... | 219, මොරගොඩ, ගම්පහ |
| ලැම්බට්, ලූ. ක්‍රි. | ... | වංකාලයි |
| ලීලාරත්න, ව. ප. | ... | විශුද්ධාරාමය ඉදිරිපිට, මහගෙදර කන්ද, අහංගම |
| ලෙයොන්, ඥ. | ... | 9/3, මරුතඩි පාර, යාපනය |
| ලොකුසූරිය, දෙ. ජී. | ... | තැපැල් හා විදුලි සංදේශ ඉංජිනේරු කර්මාන්ත ශාලාව, තැ. පෙ. 1438, කොළඹ 10. |
| වනිගසේකර, ගු. | ... | ''හද්‍රා'', ඉහලවිටියල, කරගොඩ උයන්ගොඩ |
| වයිරමුත්තු, ක. | ... | පූත්තලයි, වීරපතිර කොවිල්ලඩි, දකුණු පූලෝලි, පේද්‍රුරුතුඩුව |
| වල්ලිපුරම්, කා. | ... | මුතලයික්කුලි, දකුණ කරණවායි, කරවෙඩ්ඩි |
| වැලිගෙපොල, අ. මු. ර. බ. | ... | වැලිගෙපොල, බලන්ගොඩ |
| වික්‍රමතිලක, වි. අ. | ... | කියවීම් අංශය, රජයේ මුද්‍රණාලය, කොළඹ |
| වික්‍රමසිංහ, බ. ම. | ... | ගොන්නව, මොරගනේ, කුරුණෑගල |
| විජයසිංහ, දෙ. ආ. | ... | ''සෙත්සිරි මැදුර'', ගෝනගල, ඉඳුරුව |
| විජයසේන, හ. ජේ. | ... | නො. 63, පලුගස්දමන, පොළොන්නරුව |
| විජේතිලක, ගි. ග. ටි. | ... | ''අජන්තා'', කිතුලම්පිටිය පාර, ගාල්ල |
| විජේරත්න, කො. ලි. ල. | ... | ''දිවල ගිරි'', කඩුගන්නාව |
| විජේරත්න, න. ආ. | ... | ''විමල්සෙවන'', නරවැල්පිට උතුර, හක්මන |
| විජේවර්ධන, ව. මු. ඉ. | ... | රහස් අංශය, රජයේ මුද්‍රණාලය, කොළඹ 8 |
| විජේසිරි, ම. ආ. | ... | ''පීfල්ඩ් විව්'', පාඩාගොඩ, බේරුවල |
| විජේසිංහ, ඩේ. ඇ. | ... | ඒ. සී. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| විජේසේකර, ර. කු. | ... | සුධර්මාධාර විද්‍යාලය, තුන්දූව, හබුරුගල |
| වින්සන්, සි. පු. | ... | කුණුතිප්පල, උඩුබද්දව |
| විමලතිස්ස, ජා. තැ. | ... | ''චන්ද්‍රගිරි'', නාපේ, නෙළුන්දෙණිය |
| විමලරත්න බණ්ඩා, යා. මු. | ... | කොහොඹිලිවෙල, මාතලේ |
| විමලසේන, උ. | ... | කටුහේන, මීවනපලාන |
| විමලසේන, කො. වි. | ... | බෝපිටිය, වලල්ලාවිට |
| විමලසේන, ම. දු. | ... | දෙයියන්ගෙවත්ත, දික්වැල්ල |
| විමලසේන, ර. | ... | නයිලිය, බෝයගනේ |
| විමලසේන, ලො. ව. | ... | වීදගම, බණ්ඩාරගම |

| නම | | ලිපිනය |
|---|---|---|
| විල්මට්, ක. දේ. | ... | මනෝරම්‍ය, බටදූව, ගාල්ල |
| විල්සන්, ග. ගෙ. | ... | බෙහෙත් ශාලාව, ගල් අමුණ, හුරිකඩුව |
| විලියම්, සෙ. ර. | ... | මූලන, හුංගම |
| විලියම් සිංඤෝ, පෝ. | ... | 127, පර්නාපය කන්ද, පූගොඩ |
| වීරමන්ත්‍රී, ජ. | ... | නො. 103, බදගිරිය, වැලිගත්ත |
| වීරවර්ධන, ජ. අ. | ... | වැටියගෙදර, එක්සත් වෙළඳසැල බාරේ, නිකවැරටිය |
| වීරසිරි, වි. | ... | බලපාත කඩේ, ඉළුප්පැල්ල, අකුරැස්ස |
| වීරසිංහ, ගු. ද. අ. | ... | පහලවෙල, තලංගම දකුණ, තලංගම |
| වීරසිංහ, හ. | ... | නො. 8, කොළඹ පාර, කුරුණෑගල |
| වීරසිංහ, හෙ. | ... | අධ්‍යාපන කායසීාලය, බණ්ඩාරවෙල |
| වීරසිංහ, හෙ. කො. | ... | පොල්වැවීම හා නගා සිටුවීමේ දෙපාර්තමේන්තුව, වයි. එම්. බී. ඒ. ගොඩනැගිල්ල, කොළඹ 1 |
| වීරසේකර, ක්‍රි. | ... | කෝට්ටගොඩ වලව්ව, උඩිස්පත්තුව |
| වෙත්තසිංහ, මෙ. | ... | බටුවත්ත, රාගම |
| වේරගොඩ, ද. නා. | ... | උළුවිටිකේ, ගාල්ල |
| සච්චිතානන්නම්, අ. | ... | තන්නීර්තාල්වු, කටුවන්, තෙල්ලිප්පලෙයි |
| සබානායගම්, මා. ක. | ... | දකුණු අරලි, වඩ්ඩුක්කොඩ්ඩෙයි |
| සමද්, ජෙ. අ. | ... | දෙහි අංග, මුරුතලාව |
| සමරතුංග, කැ. ප. ලෙ. කො. | ... | ලක්ෂ්මි හෝටලය බාරේ, අවිස්සාවේල්ල |
| සමරවීර, කි. ව. පෙ. | ... | දෙරටියාව, කුරුණෑගල |
| සමරවීර, මු. තැ. | ... | ''සමරපාය'', 65/19, තිස්සපුරය, මල්වත්ත. |
| සමරසිංහ, වි. මු. | ... | ඔව්ලාන, ඕලුආර, වලස්මුල්ල |
| සමරසේකර, ධ. | ... | උඩුකාව, දෙණිපිටිය |
| සමරසේකර, මු. ග. | ... | ඉඹුල්පිටිය, ගොඩගම්පල |
| සමරසේකර, ව. රා. මු. | ... | වැකඩ, සදලංකාව |
| සමරා, පු. හි. | ... | ඉදිහේන, කොබෙයිගනේ |
| සයිනේරිස්, නා. පා. ත. | ... | වැලිකොන්ද මහවත්ත, දෙරපේ. අහුලුගහ |
| සරවනමුත්තු, ඔ. රා. | ... | හල්පෙ, කටාන |
| සිමියොන් සිංඤෝ, කැ. මා. | ... | ඉන්දෙල වත්ත, අයගම |
| සිරිපාල, මැ. වි. | ... | " රුවන්පහය " ඉහලනාරගල, ගෝවින්න |
| සිරිපාල, වි. මා. | ... | මීගස්තැන්න, යටියන්තොට |
| සිරිල්, ර. ප. | ... | ගුරුගොඩැල්ල, උනාකුරුව, තංගල්ල |
| සිරිවර්ධන, මි. ක. | ... | ඇම්. ඩී. ඇස්. ජයසිංහ මහතා බාරේ, පිටුවල්ගොඩ, යක්කල |
| සිරිසේන, උ. ලි. | ... | නො. 83, ගල්බොක්ක, අරණායක |
| සිරිසේන, කු. ලේ. | ... | ප්‍රාථමික පාසැල, අනුරාධපුරය |
| සිරිසේන, කෝ. ආ. | ... | කිදෙල්පිටිය, වැල්මිල්ලහන්දිය |
| සිරිසේන, ජ. වි. ප. | ... | වලගය වත්ත, ඇල්ගිරිය, තෙලිජ්ජවිල |
| සිරිසේන, රි. ගෙ. | ... | යටිහලගල, පල්ලේගම, හල්ඔළුව |
| සිරිසේන, ලැ. හේ. | ... | ''අරුණෝදය'', දෙඩන්දූව |
| සිරිසේන, හේ. තු. | ... | ඕකන්ද, කඳුරුවාන, පිටබැද්දර |
| සිරිසේන, හෝ. පේ. | ... | නො. 86, වතුර |
| සිල්වා, ර. ඉ. | ... | ඊරියගහදෙල, බටපොල |
| සිවඥනම්, ව. | ... | කලට්ටියාවත්ත, දකුණු අල්වායි, අල්වායි |
| සිවරාජ, ති. | ... | තංගත්තෙරු, තුම්පලෙයි, පේද්‍රුරුතුඩුව |
| සිවරාජා, මු. | ... | චෙට්ටිත්තෙරු, සිවන්කෝවිලඩි, පේද්‍රුරුතුඩුව |
| සිවානන්තසෝති, තා. | ... | දකුණු කරම්පන්, කයිට්ස් |
| සුදුබණ්ඩා, බා. මු. | ... | ගෙදරවෙල, පාළුගම, කැප්පිටිපොල |
| සුන්දරබණ්ඩා, ජ. ආ. | ... | ''පොල්වත්ත'', රිල්ලොළුව, ගිරිඋල්ල |
| සුන්දරලිංගම්, ආ. | ... | උතුරු මඩ්ඩුවිල්, චාවකච්චේරි |
| සුන්දරලිංගම්, පො. | ... | කරාලර්වලව්, දකුණ අල්වායි, අල්වායි |
| සුබසිංහ, ග. ආ. | ... | මරක්කලමුල්ල, දුම්මලසූරිය |
| සුබසිංහ, තු. ද. | ... | මාකුර, හෙට්ටිමුල්ල |
| සුමනදස, බෝ. | ... | සියඹලාගහවත්ත, මීගහගොඩ, අහංගම |
| සුමනපාල, හෙ. සි. | ... | ''අනුලානි'', කළුවාමෝදර, අළුත්ගම |
| සුමනසිරි, කා. හො. ග. | ... | " චන්ද්‍රාවාසං ", හොරගම්පිට, ගිනිමැල්ලගහ |
| සුමනසේන, අ. ආ. | ... | නො. 27, කඳුරුපොකුණ පාර, තංගල්ල |
| සූරසේන, පා. ක. | ... | කදුරුදූව, වංචාවල, ගාල්ල |
| සෙනරත්, පි. | ... | ග්‍රාමසේවක, උඩයාල, හකුරුවෙල |
| සෙනෙවිරත්න, කු. ඩී. | ... | නො. 140, රණවන පාර, කටුගස්තොට |
| සෙයින්, මො. තා. අ. | ... | සී/දෙහිවල ඊලාද් රජයේ මුස්ලිම් මිශ්‍ර පාසැල, දෙහිවල |
| සෙල්වරාජා, ක. | ... | 2 වැනි කොට්ඨාශය, නිලවේලි, ත්‍රිකුණාමලේ |
| සේදිරිස්, ර. | ... | කන්දේදෙනිය, මාලියද්ද, බැද්දවල |

| නම | | ලිපිනය |
|---|---|---|
| සේනානායක, පි. බ. | ... | කුඩා–උඩුව, හොරණ |
| සොයිසා. ධ. කු. | ... | අංක 276, දඩල්ල, ගාල්ල |
| සෝමදස, ස. වී. | ... | කෝන්දෙනිය, දික්වැල්ල |
| සෝමපාල, පි. | ... | මුවපිටිය, රඹුක්කන |
| සෝමපාල, ර. මු. | ... | "රත්නනිවස", හේනේගම, අකුරැස්ස |
| සෝමපාල, ලැ. ක. | ... | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්ත මේන්තුව, තැ. පෙ. 563, කොළඹ |
| සෝමවීර, ර. හේ. | ... | පුස්වැල්කඩ, අහුළුගහ |
| සෝමසිරි, මා. කු. | ... | නො. 25, වැල්කන්දල, මතුගම |
| සෝමසිරි, ස. | ... | පිංහේන, බේරුවල |
| සෝමසිරිදේව, හේ. හ. | ... | මඩකුඹුර, මහජ්දණ්ඩ |
| සෝමසුන්දරම්, පො. | ... | පෙරියපුලම්, පොලිකන්ඩි, වෙල්වෙට්ටි තුරෙයි |
| සෝමසේගරම්, ජේ. | ... | බටහිරවඩ්ඩුකොඩ්ඩෙයි, වඩ්ඩුකොඩ්-ඩෙයි |
| හින්නි අප්පුහාමි, මා. ආ. | ... | මුට්ටුක්කාරිගෙවත්ත, සුල්තානාගොඩ, මාතර |
| හින්නිඅප්පුහාමි, සී. ගෙ. | ... | රාවණාගොඩ, විජයබාහුකන්ද, කොත්-මලේ |
| හීන්බණ්ඩා, හේ. මු. | ... | වරාගස්පිටිය, පොතුහැර |
| හෙට්ටිආරච්චි, ජෝ. ලි. | ... | නො. 276, ගොරකාන මොරටුව |
| හෙන්ද්‍රික්, ගි. ලි. | ... | පල්ලෙහගෙවත්ත, මඩුවල, දෙයියන්දර |
| හේමපාල, ගා. මා. | ... | රජයේ රෝහල, හම්බන්තොට |
| හේරත්, ඩී. බ. | ... | බූලත්වත්ත, පිලැස්ස |
| හේරත්, වී. බ. | ... | පටලිය, අත්හන්දිය, කුරුණෑගල |
| හේරත් බණ්ඩා, ක. ආ. | ... | බමුණුමුල්ල, හෙට්ටිපොල |
| හේරත් බණ්ඩා, වෙ. | ... | අංක 52, විලව, බලල්ල |

2. මේ අපේක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. එහෙත් ඇබෑර්තු ඇති වන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියලුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, වෛද්‍ය පරීක්ෂණයකට සහ සාමාන්‍ය ලිපිකරු සේවයේ කොන්දේසිවලට යටත් වනවා ඇත.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩබලන නියෝජ්‍ය ලේකම්.

1964 පෙබරවාරි 20 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

2–805—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

## කණිෂ්ඨ කාර්මික විද්‍යාලයය—ගාල්ල

**1964/65 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීම**

**පාඨ මාලා :—සම්පූර්ණ දිවාකාල දෑවුරුදු පංති.**

(අ) වෘත්තීය පංති (ඉගැන්වීම සිංහල මාධ්‍යයෙනි)

1. යාන්ත්‍රික කර්මාන්ත.

(1) ලෝහ වැඩ

(2) මෝටර් යාන්ත්‍රික විද්‍යාව

2. ගොඩනැගිලි කර්මාන්ත.

(1) වඩු වැඩ.

(2) විදුලි කම්බි සවි කිරීම.

**(ආ) වාණිජ විද්‍යා සහතික පත්‍ර (සිංහල/ඉංග්‍රීසි) පංති.**

(1) ගණන් තැබීම.

(2) ලඝු ලේඛනය සහ ටයිප් ගැසීම.

**සවස්කාල පංති**

**(ඇ) බිම් මැනීම සහ මට්ටම් කිරීම (තුන් අවුරුදු) පංති.**

**(ඈ) ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භ (එක් අවුරුදු) පංති.**

**(ඉ) ගණන් තබන්නන්ගේ සහ ලඝු ලේඛක ටයිප් ගසන්නන් දෑවුරුදු පංති.**

**(ඊ) යාන්ත්‍රික ඉංජිනේරු තුන් අවුරුදු පංති.**

**(උ) විද්‍යුත් ඉංජිනේරු තුන් අවුරුදු පංති.**

**(ඌ) නිර්මාණ ඉංජිනේරු තුන් අවුරුදු පංති.**

**(එ) ගෘහ නිර්මාණ ශිල්පය තුන් අවුරුදු පංති.**

**ඉල්ලුම් පත් ආකෘති පත්‍ර 1964 මාර්තු මස 16 වැනි දින** ප. ව. 4.30 දක්වා ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයීය කාර්යාලයෙන් ලබා ගත හැක. ආකෘති පත්‍ර තැපෑලෙන් ඉල්ලන විට තමන්ගේ ලිපිනය සඳහන් මුද්දර නොගැසූ ලියුම් කවරයක් ද එවිය යුතුයි. තමන් ඇතුල්වීමට බලාපොරොත්තු වන පාඨමාලාව ද පැහැදිලි ලෙස ලියා එවිය යුතුයි.

ඉල්ලුම් පත්‍ර 1964 මාර්තු මස 19 වැනි දින ප. ව. 4.30 ට හෝ ඊට පෙර ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

වැඩි විස්තර සඳහා රුපියලක් ගෙවීමෙන් ගාල්ලේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයාධිපතිගෙන් ලබාගතහැකි 1964/65 අධ්‍යයන වර්ෂයේ අත්පොත බලන්න. තැපෑලෙන් අත්පොත ලබාගැනීමට කැමති අය රුපියලක පෝස්ටල් ඕඩරයක් සහ ශත විස්සක තැපැල් මුද්දර සමග ඉල්ලුම් කළයුතුයි.

ජෝ. එම්. ඩී. පෙරේරා,
වැඩබලන ලේඛකාධිකාරී.

1964 පෙබරවාරි 18 වැනි දින,
කොළඹ, ලංකා කාර්මික විද්‍යාලීය
දෙපාර්තමේන්තුවේදීය.

2–808—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය කොළඹ 1—මිශ්‍ර ලෝහ ඇළුමිනියම් පිලි සහිත තහඩු සැපයීම සඳහා 1964 ජූනි 2 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964 ජූනි 1 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝර්ම් කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩරකරුවන් සඳහා විශේෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
වැඩබලන ගබඩා අධිකාරි.

1964 පෙබරවාරි 28 වැනි දින,
කොළඹදීය.

2–940—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1), ශුද්ධ කිරීමට ගන්නා කුඩු වර්ග සැපයීම සඳහා 1964. 4. 14 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964. 4. 11 වැනි සෙනසුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964. 2. 28 වැනි දින,
කොළඹදීය.

2–938—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ වෙත්කල්අඩි උප කොටසේ හීනගලකන්ඩිය වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම් පත්‍ර කොළඹ 1, මහාලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග, හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 මාර්තු 24 වෙනි අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 100,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ පස් වැඩ කිරීමට යොග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක. මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම අනුපිටපතක් සමඟ පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 200 ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, කාර්යාලයීය වේලාවන් තුළදී 1964 මාර්තු මස 20 වෙනි සිකුරාදා හෝ ඊට පෙර ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක.

මේ ගැන වැඩි විස්තර මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

නා. පෙරියතම්බි,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1964 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ.

2–769—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### තිස්ස උප කොට්ඨාශය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් බෙරලිය වැව යටතේ වාරිමාර්ග පහසුකම් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1964 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000.00කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1964 මාර්තු මස 20 වෙනි සිකුරාදා වන තෙක් එදිනද ඇතුළුව කාර්යාල වේලාවන් තුළදී තිස්ස වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී, ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ක ටෙන්ඩර් ඇප තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළ දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ආර්. මුතුකුමාරස්වාමි,
තිස්ස උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරුතැන.

1964 පෙබරවාරි මස 13 වෙනි දින,
තිස්ස, වාරිමාර්ග කාර්යාලයේදී ය.

2–771—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව උප කොට්ඨාශය

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 මාර්තු මස 24 වෙනි අඟහරුවාද පෙරවරු 10.00 දක්වා පොළොන්නරුවේ ඊසාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

| වැඩෙහි නම | කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි ප්‍රමාණය | ටෙන්ඩර් තැන්පත් ගණන |
|---|---|---|
| 1. කඩවලවැව ව්‍යාපාරය යටතේ වාරිමාර්ග පහසුකම් සැලසීම | රු. 26,000ට හා ඊට වැඩි | රු. 50 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එක් එක් වැඩ ඉදිරියෙන් ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවනට හා විවිධසේවා සමූපාකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 මාර්තු මස 20 වෙනි සිකුරාද වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී පොළොන්නරුවේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම පළමුවන ඡෙදයේ එක් එක් වැඩ ඉදිරියෙන් ඇති ප්‍රමාණයට ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇම්. ජී. සී. පී. විජයතිලක,
වාරිමාර්ග ඉංජිනේරු,
පොළොන්නරුව උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
පොළොන්නරුව,
1964 පෙබරවාරි 21 වැනි දින.

2–913—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාරියපොල රජයේ ගොවිපොලේ පොල් විකිණීම

අනුරාධපුර නව නගරයේ, කෘෂිකර්ම නිලධාරී (ගොවිපොල පාලන හා නිෂ්පාදන) තැනගේ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, වාරියපොල රජයේ ගොවිපලේ ඇති, ගෙඩි පොල් 12,000 ක් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර, 1964 මාර්තු මස 12 වෙනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. අනුරාධපුර කෘෂිකර්ම නිලධාරී (ගොවිපොල පාලන හා නිෂ්පාදන) තැනගෙන් ආකෘති පත්‍ර ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා, මුද්‍රා තබා, "අනුරාධපුර නව නගරයේ, කෘෂිකර්ම නිලධාරී (ගොවිපොල පාලන හා නිෂ්පාදන) තැනගේ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" යන්න එහි පිට ලියා, එහි මුදුනේ, වම් කෙළවරෙහි, "වාරියපොල රජයේ ගොවිපොලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව සීල් තබන ලද කවරයක් තුළ බහා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවතොත්, ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින්, අනුරාධපුර නව නගරයේ, කෘෂිකර්ම නිලධාරී (ගොවිපොල පාලන හා නිෂ්පාදන) තැනගේ කාර්යාලයේ, පරිපාලන නිලධාරිට ඒවා අතින්ම භාර දිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ, "වාරියපොල රජයේ ගොවිපොලේ පොල් සඳහා, ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කළ දිනයේම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත්, ඔහු අනුරාධපුර, කෘෂිකර්ම නිලධාරි (ගොවිපොල පාලන හා නිෂ්පාදන) තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. 1964.3.12 වෙනි දින දවල් 12 වෙන තෙක්, ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරණු ලබන්නේ, පොල් සඳහා ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැක. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින 10 ක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත් කර ගත යුතුයි. එසේ නොහැකි වූවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති, නැතහොත්, එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත්, ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම නම හා ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත්, බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

9. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩ කිරීම සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවාගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ, 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වෙනි පරිච්ඡේදය) යටතේ තමාගේ සේවකයෙකු හෝ සේවිකාවක වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුය.

11. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත්, ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත්, ඔහු අතටම භාර දුන්නා ලෙස සැළකේ.

12. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු, කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග නම ඇතුලත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණු ලබන, මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුය.

15. පිළිගත් ටෙන්ඩර්කරු, ඔහුගේ ටෙන්ඩරය භාර ගත් බව දක්වන ලිපිය ලැබී, දින දහයක් ඇතුළත පොල් වලට ගෙවා ඉවත් කර ගත යුතුය.

16. පිළිගත් ටෙන්ඩර්කරු, පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ඉවත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර, වාරියපොල රජයේ ගොවිපල භාර කළමනාකාර තැනගෙන් දැන ගත හැක.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 පෙබරවාරි මස 21 වන දින,
පේරාදෙණියේදීය.

2–881/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සත්ව ගොවිපලවලට සැපයීම් හා සේවාවන්

පහත සඳහන් ද්‍රව්‍ය ඒ ඒ ගොවිපලවලට ගෙන ගොස් භාරදීමට හා ඒ ඒ ගොවිපලවලින් බැහැර කර ලීම සඳහා, කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964.3.24 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**සැපයීම් :**

(1) කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට—වැලි කියුබ් ... 50යි

(2) පොලොන්නරුවේ සත්ව ගොවිපලට—පොල් අතු ... 10,000යි.

(3) නමන්කඩුවේ සත්ව ව්‍යාපාරයට—පොල් අතු ... 15,000යි.

(4) කොළඹ, සත්ව නිරෝධායන මධ්‍යස්ථානයට—පිදුරු ටොන් ... ... 5යි.

(5) රිදියගම ගොවිපලට—පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් .. 1,000යි.

(6) කොළඹ, සත්ව නිරෝධායන මධ්‍යස්ථානයට—පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් ... 500යි.

**අස් කරගත යුතු දෑ :**

(1) පොලොන්නරුවේ සත්ව ගොවිපල—තලඇට හොණ්ඩර 10 යි.

**විස්තර :**

(1) පොල් අතු : දිගින් අඩි පහක (5) ට නොඅඩු ඉරු දෙකේ පොල් අතු.

(2) පිදුරු : මනාසේ වේලුනු ගොයම් පිදුරු, රාත්තල් 5 හේ පමණ මිටිවලින් සැපයිය යුතුය.

(3) ප්‍රවෘත්ති පත්‍ර : තොකිළිටි, නොඉරුණු, දිනමිණ, ඩේලි නිවුස් ප්‍රමාණයේ හා ඒ සමාන කඩදාසිවල ප්‍රවෘත්ති පත්‍ර විය යුතුය.

රිදියගම ගොවිපලට රාත්තල් 200 ක් මාසයක් ඇතුළත දී හා ඉතිරිය මාස හයකින් සැපයිය යුතුය.

සත්ව නිරෝධායන මධ්‍යස්ථානයට සති දෙකක් ඇතුළත දී රාත්තල් 100 ක් හා ඉතිරිය මාස තුනක් ඇතුළතදී සැපයිය යුතුය.

(4) තල-ඇට : තෝරාගත් කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළතදී සම්පූර්ණ ප්‍රමාණය ගොවිපලින් බැහැර කර ගත යුතුය.

(5) වැලි : පස් රහිත ගඟේ වැලි විය යුතුය.

(සැ. යු.—නමන්කඩුවට පොල් අතු : මුදල් ගෙවා වැලිකන්දේ දුම්රිය ස්ථානයට යැවීමට හෝ වැලිකන්දේ කෘෂිකර්ම ගබඩාවට ගෙන ගොස් භාරදීමට ටෙන්ඩර් භාරගනු ලැබේ.)

2. ටෙන්ඩර් ආකෘති ලබාගැනීම සඳහා එක් එක් ද්‍රව්‍ය වෙනුවෙන් රුපියල් දහය (රු 10) බැගින් වෙන වෙනම තැන්පත් කළ යුතුය. **මුදල් තැන්පත් කිරීම පේරාදෙණියේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ හෝ කච්චේරියක හෝ නැතහොත් මහා භාණ්ඩාගාරයේ හෝ කළ හැකිය.**

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා මෙම කාර්යාලය යටතේ, දිසාපති යටතේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව යටතේ, අධ්‍යාපන අධ්‍යක්ෂක යටතේ හෝ වාරිමාර්ග අධ්‍යක්ෂක යටතේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් 1964. 3. 17 දින පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ :—

(1) කඩවලගෙදර අමුණ බැඳීම—ව. හ. ප.
(2) එරියාව පාර—බෝක්කුවක් බැඳීම—ව. හ. ප.
(3) උණගහමුල අමුණ—හොරොව්වක් බැඳීම—නි. හ. ප.
(4) මටලුවාව වැව—හොරොව්වක් සෑදීම—හි. හ. ප.
(5) කොක්කාගල අමුණ—අමුණක් බැඳීම—ද. දෙ. හ. ප.
(6) නෙලවුල්ල නිකමුනේ අමුණ—අමුණක් බැඳීම—වැ. හ. ප.
(7) අම්බේවෙල්යායේ අමුණ—අමුණක් බැඳීම—වැ. වි. හ. ප.
(8) ගල්කඩවල වැව—හොරොව්ව අලුත්වැඩියා කිරීම—ව. හ. ප.
(9) ගල ඉහල වැව—අලුත්වැඩියා කිරීම—ව. හ. ප.
(10) මොරගහමුල යායේ ඇල—අමුණක් බැඳීම—හි. හ. ප.
(11) තිබ්බොටුවාව වැව—සිමෙන්ති හොරොව්වක් සෑදීම—හි. හ. ප.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයෙන් නිකුත් කරණ ලද ටෙන්ඩර් පත්‍ර වලය. ටෙන්ඩර් පත්‍ර 1964.3.16 දින පස්වරු 2 දක්වා නිකුත් කරණු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර කච්චේරියේ රු. 10 ක් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි සහතික ද ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර අඩංගු ලියුම් කවරය සීල් තබා ලියාපදිංචි තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් ටෙන්ඩර් කළ හැක. වැඩයේ නම ද ලියුම් කවරයේ සඳහන් විය යුතුය. මේ ටෙන්ඩර් පිළිබඳව සියළුම විස්තර කාර්යාල වේලාව තුල ලබා ගැනීමට හැකි වේ.

ඩී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කාර්යාලය,
තැ. පෙ. 51, නො. 76, නුවර පාර,
කුරුණෑගල, 1964.2.20.

2–833—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙම කාර්යාලය යටතේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

ඒ. තුම්පනේ පොල්වත්ත නිග්ගොල්ලාවෙල අමුණ වැඩි දියුණු කිරීම—තුම්පනේ.
බී. හාරිස්පත්තුව ගල්ගානේ ඇලේ කඩාඩුව ප්‍රතිසංස්කරණය—හාරිස්පත්තුව.
සී. මහවත්ත ගල්ගොඩහින්න අමුණ වැඩි දියුණු කිරීම—පාත දුම්බර.
ඩී. සූලියද්දේ මහ ඇල තැනීම—පාත හේවාහැට.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයෙන් නිකුත් කරන ලද ටෙන්ඩර් පත්‍රවලය. ටෙන්ඩර් පත්‍ර 1964.3.14 වැනි දින දවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර කච්චේරියේ රු. 10ක් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතු ය. ටෙන්ඩර් පත්‍ර අඩංගු ලියුම් කවරය සීල් තබා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ ලිපිනයට 1964.3.16 වැනි දින පෙ. ව. 9.30 ට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් ටෙන්ඩර් කළ හැකි ය. වැඩයේ නම ද ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ සඳහන් විය යුතු ය. මේ ටෙන්ඩර් පිළිබඳ සියළුම විස්තර කාර්යාල වේලාව තුළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

ගා. ආ. ම. කරුණාරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර, 1964 පෙබරවාරි 20 දින.
ලේකම් කාර්යාලය,
මහනුවර, 1964 පෙබරවාරි, 20 දින.

2–861—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

"මැලවයිඩ් ග්‍රීන්" නම් පාට කුඩු සැපයීම සඳහා

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංශ අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් "මැලවයිඩ් ග්‍රීන්" නම් පාට කුඩු ටොන් 3 ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1964 මාර්තු 20 වෙනි සිකුරාදා අ. භා. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙසෙහි ගණකාධිකාරී තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් දෙපාර්තමේන්තුවේ අංක 336 ඩීන්ස් පාරෙහි පිහිටි නි. මි. යෝ. ක්‍රා. හා වී කෙටීමේ අංශයෙන් 1964 මාර්තු 20 වැනි දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. ටැන්ඩර් කරුවන් විසින් සපයනු ලබන "මැලවයිඩ් ග්‍රීන්" හෝ සමාන පාට කුඩු ඇතුලත් සීල් තබන ලද සැම්පල් ටැන්ඩර් අවසාන දින හෝ ඊට පෙර ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 336 දරණ ස්ථානයෙහි නි. මි. යෝ. ක්‍රා. වී. කෙ. අංශයෙන් කාර්යාලයට භාරදිය යුතුයි.

4. වැඩි විස්තර පහත අත්සන් කරන ලබන අයගෙන් හෝ අංක 336, ඩීන්ස් පාරේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තු කාර්යාලයෙන් දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම.)

1964. 2. 28 දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

2–900—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

**චීන වරායේ තේක්ක පැල තවානට වතුර ඉසීමේ උපකරණ සැපයීම සහ ඒවා සවිකිරීම සඳහා ටැන්ඩර් කැඳවීම**

චීන වරායේ තේක්ක පැල තවානට වතුර ඉසීම සඳහා අවශ්‍ය උපකරණ සැපයීම සහ ඒවා සවිකිරීම සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත් සහ කොන්දේසි පිළිබඳ විස්තර කොළඹ, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ චීන වරායේ වන විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ 64.3.12 දින තෙක් පමණි.

ඩබ්ලිව්. ජී. වීරරත්න,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
කිව් පාර, කොළඹ 2,
1964 පෙබරවාරි මස 21 වැනි දින.

2–866—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

(1) දෙල්මැල්ල ඇලට පැති බැම්මක් බැඳීම—කුඹලිගම, නැගෙනහිර පස්දුන් කෝරළය.

(2) හල්ගහඇලට ජල ප්‍රමාණකයක් තැනීම—හොරවල බටහිර පස් දුන් කෝරළය.

(3) මිරිස්වත්ත දොල ජල ප්‍රමාණකය තැනීම—ඉත්තපාන, බටහිර පස්දුන් කෝරළය.

(4) කිතුලවිලයාය පිටල කඩාඩුව බැඳීම—ඉහල මිල්ලැව, රයිගම් කෝරළය.

(5) ගල ලඟ වේල්ල අමුණ තැනීම—සේරුපිට, කලුතර තොටමුණ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නො ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1964 මාර්තු මස 16 දින දවල් 12 දක්වා කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමකෙක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "............ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1964 මාර්තු මස 17 දින දවල් 12 ට පෙර කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව කලුතර දිස්ත්‍රිකක්යේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරී තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙනඩර්කරු විසින් කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතුන් උඩ කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුයි.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කලුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1964 මාර්තු මස 18 දින ප. ව. 2 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

එස්. ඩබ්ලිව්. ඒ. ද සිල්වා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කලුතර දිස්ත්‍රික්කය.

කලුතර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය.
1964 පෙබරවාරි 22 දින දීය.

2–904—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ 6, කිරුළපොනේ මධ්‍යම වැඩපලෙහි ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් සේවයට අදාල නොවූ ටයර් සහ වියුබ්ද බැටරිද, ඉරුපු ලී ද සේවයට අදාල නොවූ බඩුබාහිරාදිය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් 1964.3.18 දින පස්වරු 1 තෙක් කැඳවනු ලැබේ. මේ සියලු උපකරණ කොළඹ 6, කිරුළපොනේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම වැඩපලෙහි ගොඩගසා ඇති බැව් සලකන්න.

2. 1964.3.17 වැනි දින දාවල් 12 තෙක් කොළඹ 6, කිරුළපොනේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම වැඩපලෙහි හා ගබඩාවෙහි ගණකාධිකාරි තැනගෙන් ලබාගත හැකි පෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායර්ාලයේ හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් බහාලු කවරය මුද්‍රාතබා "සේවයට අදාල නොවූ ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් වම් අත පැත්තෙහි උඩ කෙළවරෙහි සඳහන් කොට කොළඹ 6, කිරුළපොනේ හා ගබඩාවෙහි ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි තැපෑලෙන් හෝ කිරුළපොනේ මධ්‍යම වැඩපලෙහි ගණකාධිකාරි තැනගේ ටෙන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයි.

4. කොළඹ 6, කිරුළපොනේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම වැඩපළෙහි හා ගබඩාවෙහිදී 1964.3.18 දින පස්වරු 1 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

5. ටෙන්ඩර්කරුවන් විසින් 1964.2.28 දින සිට 1964.3.17 දක්වා (සතියේ දිනවල පෙ. ව. 9.00 සිට පස්වරු 3.30 දක්වාද සෙනසුරාදා දිනයන්හි පෙ. ව. 9.00 සිට දාවල් 12.00 දක්වාද) පරීක්ෂා කළ යුතුයි. වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ හැක.

6. ටෙන්ඩර් පිළිගත් බැව් දන්වා දින 10 ක් ඇතුලතදී සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරනු ලැබූ සම්පූර්ණ මුදල ගෙවා දින 14 ක් ඇතුලතදී උපකරණ ගෙන යා යුතුයි. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ද්‍රව්‍ය ගෙනයාම සඳහා පිළිවෙලක් යොදා ගත යුතුයි. මේ කාලය තුලදී යම් කිසිවක් ගබඩාවෙහි ඉතිරිවීමට ඉඩ හැරියොත් ඒවා විකිණීමට හෝ කිසිවක් කිරීමට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකට හැකිවාක් මෙන්ම ටෙන්ඩර්කරුට ඒ ගැන වගකීමක් නොමැත්තේ ය. ඒ ගැන ඉදිරිපත් වීමට හැක්කේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන සෑහීමකට පත්වුවහොත් පමණි. යම්හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු පැහැර හැරියොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත්වෙනවා පමණක් නොව රජයේ කිසිම කොන්ත්‍රාත්තුවකට ඔහට ඉදිරිපත් විය නොහැක්කේ ය.

7. කිරුළපොනේ මධ්‍යම ගබඩාවෙහි ගොඩගසා ඇති එක ගොඩක් හෝ ගොඩවල් කීපයක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකියි. ටෙන්ඩරයේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂෙප කිරීමට හෝ එයින් කොටසක් භාරගැනීමේ හෝ බලය රජය සතුය.

සී. ද. පොන්සේකා,
ඉ. ස. අ. තැන වෙනුවට.

1964.2.24 දින,
එව්ලන් චතුරශ්‍රයෙහි
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී ය.

2–924—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### ලොරි සහ ටිපර් සැපයීම හා බෙදා හැරීම

1964 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා පෙරවරු 9.30 වන තෙක් කොළඹ පළාත් පාලන හා නිවාස දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා පහත සඳහන් උපකරණ රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමාට සැපයීමට හා බෙදා හැරීමට ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. මෙදින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ කාමරයට පැමිණ සිටිය හැක.

(1) ලොරි 2 ක් සැපයීම සහ,
(2) ටිපර් 1 ක් සැපයීම.

පරීක්ෂා කිරීම සඳහා ටෙන්ඩර් ලිපි ද්‍රව්‍ය රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙහි තබා ඇත.

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තුමාට (නිර්මාන හා නඩත්තු) ටෙන්ඩර් පත් එවන ටෙන්ඩර්කරුවන්ට රුපියල් 100 ක් තැන්පත් කොට මෙම දෙපාර්තමේන්තුවෙන් හෝ ඕනෑම කච්චේරියකින් ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු මීට අදාල ටෙන්ඩර් ලියකියවිලි සපයනු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු ගෙවනු ලැබේ.

පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් :—" වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් " ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති සහ ;
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

පූරවා එවිය යුත්තේ ඉහත සඳහන් අයුරින් ලබාගත් ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. 1964 මාර්තු මස 13 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියවිලි නිකුත් කරනු ලැබේ.

ලාංකික සබඳතා ඇති මාර්ගයන්ගෙන් එනම්, ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, අවුස්ත්‍රියාව, බුල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, අස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුවේනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, රුසියාව හා යුගෝස්ලාවියාව ආදී රටවලින් බඩු ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම පිළිබඳ පාලක තැන විසින් නිකුත් කරන ටෙන්ඩර්කරුවන් බඩු මෙරටට ගෙන්වීම පිළිබඳ පාලක තැන විසින් නිකුත් කර ඇති බඩු පිටරටින් ගෙන්වීම පිළිබඳ වලංගු වූ සාමාන්‍ය අවසර පත්‍ර සතු ලියාපදිංචි වූ ලාංකික වෙළඳුන් විය යුතුය.

සී. රාසයියා,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

1964 පෙබරවාරි මස 24 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේදීය.

2–877—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමලයේ සිට අල්ලේ ව්‍යාපාරයට ගොඩනැගිලි උපකරණ ප්‍රවාහණය කිරීම

ත්‍රිකුණාමලයේ පේද්‍රික් කොටුවේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම බඩු ගබඩාවේ සිට ත්‍රිකුණාමල මඩකලපු මාර්ගයේ 52½ සැතපුම් කණුව අසල පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ " අල්ලේ " පොදු ගොඩනැගිලි අංශයට මෙහි පහත සඳහන් කර ඇති ගොඩනැගිලි උපකරණ ප්‍රවාහනය කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් 1964 මාර්තු මස 14 වන දින පස්වරු 12 දක්වා ත්‍රිකුණාමල ඉඩම් සංවර්ධන නිලධාරි විසින් භාරගනු ලැබේ.

2. මෙම ගොඩනැගිලි උපකරණ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ත්‍රිකුණාමල මධ්‍යම බඩු ගබඩාවේ සිට වරාය දක්වා ලොරියෙන්ද, ත්‍රිකුණාමල වරායේ සිට මූතූර් දක්වා බත්තල් වලින්ද, මූතූර් සිට "අල්ලේ" ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, පොදු ගොඩනැගිලි අංශයට ලොරියෙන්ද, ගෙනයායුතුව ඇත.

(අ) දොර ජනෙල් රාමු ඇතුළත්, ලී දඬු හා ඉරන ලද ලී දඬු—ඝන අඩි 4,509
(ආ) සිමෙන්ති හොණ්ඩර 1,913
(ඇ) පැතලි උළු හොණ්ඩර 46.995
(ඈ) මුදුන් උළු හොණ්ඩර 1,725
(ඉ) වියාපු පොල් අතු 25,270

3. මුදලින් රු. 50ක් මෙම කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම මගෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1964 මාර්තු මස 10 වැනි දින පෙරවරු 12 දක්වා පමණි.

4. ලියාපදිංචි කරන ලද කවරයක බහා ටෙන්ඩර් පත් එවිය යුතුයි. නැතිනම් මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ **"ත්‍රිකුණාමලයේ සිට අල්ලේ දක්වා ගොඩනැගිලි උපකරණ ගෙනයෑම සඳහා ටෙන්ඩර් පත්‍ර"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් භාරගත් දින සිට සතියක් තුළදී ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 10ක්, මෙම කාර්යාලයේ තැන්පත් කොට නියමිත දින ඇතුළත දී බඩු ගෙනයෑම සාර්ථක ලෙස සම්පූර්ණ කරන බවට මා සමග ගිවිසුමකට බැඳිය යුතුයි. සැපයීම පැහැර හරින හෝ සැපයීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ නම්, කොන්දේසි කඩකරන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට සිදු වන අතර, තැන්පත් මුදල ද රාජසන්තක කරනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එනම් 1964 මාර්තු මස 14 වන දින පෙරවරු 12ට මෙම කාර්යාලයට පැමිණ සිටිය හැක.

7. වැඩි විස්තර මෙහි පහත අත්සන් කරන නිලධාරිතැන ගෙන් ලබාගත හැකිය.

අ. ක. පී. සංගරවේල්,
ඉඩම් සංවර්ධන නිලධාරි,
ත්‍රිකුණාමලය.

1964 පෙබරවාරි මස 18 වන දින,
ත්‍රිකුණාමල ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

2–922—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 මාර්තු මස 20 වැනි සිකුරාද පස්වරු 2.30 වන තෙක්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළ යුතු වැඩය |
|---|---|
| (1) කෑ/දිඹුල්ගමුව විද්‍යාලය... | පාසල් ගොඩනැගිල්ලක්, ගුරු නිවාසයක් සහ ළිඳක් තැනීම. |
| (2) කෑ/කෑගලු මුස්ලිම් විද්‍යාලය ... | විදුහල්පතිගේ නිවාසයක් තැනීම |
| (3) කෑ/කෑගලු බාලිකා මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (4) කෑ/කෑගලු මහා විද්‍යාලය | විදුහල්පතිගේ නිවාසයක් තැනීම. |
| (5) කෑ/කෑගලු බාලිකා මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (6) කෑ/මාබෝපිටිය මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (7) කෑ/රංවල මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (8) කෑ/වලගම මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (9) කෑ/දෙනවකවත්ත විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් හා වැසිකිළි දෙකක් තැනීම. |
| (10) කෑ/රොටුව උයන්වත්ත විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |
| (11) කෑ/මත්තමගොඩ මහා විද්‍යාලය ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |

සංක්ෂෙ.—කෑ=කෑගල්ල දිස්ත්‍රික්කය

2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් වශයෙන් පහත දක්වන අයුරු ලියාපදිංචි වී සිටින අයට 1964 මාර්තු 18 වෙනි බදාදා දහවල් 12 වන තෙක්, ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ :—

අංක (1) දරණ වැඩය සඳහා රු. 38,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (2) දරණ වැඩය සඳහා රු. 30,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (3) සිට අංක (5) දරණ වැඩ සඳහා රු. 25,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (6) සහ (7) දරණ වැඩ සඳහා රු. 22,500 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (8) සහ (9) දරන වැඩ සඳහා රු. 20,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක (10) සහ (11) දරණ වැඩ සඳහා රු. 15,000 ට හෝ ඊට වැඩි ගණනකටද වේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයන් විසින් කොළඹ 2, මලයි වීදියේ පිහිටි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 බැගින් මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. චෙක්පත්, මනි ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාරගනු නො ලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වවුචර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ පාසල් ගොඩනැගිලි පිළිබඳ ශාඛාවෙන් හෝ කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් හෝ ලබා ගත හැකි ය. මුදල් තැන්පත් කිරීමේ වවුචර නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචි වී ඇති බව ඔප්පු කරන කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

5. ඉහත සඳහන් දෙවන ඡෙදයේ දක්වන පරිදි කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් ලබාගත ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ දෙවන පිටපතකුත් සමග ය. සැලැස්මවල් සහ සියලුම විස්තර හා තොරතුරු එම කාර්යාලයේ දී දැනගත හැකි ය. තැපෑලෙන් එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහායක තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතු ය. ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද, වැඩයේ නමද සඳහන් කර තිබිය යුතුය.

6. වර්ෂ 1964 මාර්තු 20 වෙනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර්කරුගේ නම ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතු ය.

8. වෙනත් අවශ්‍ය විස්තර කාර්යාලීය වේලාවේ දී කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි වන අතර, ටෙන්ඩර් සම්බන්ධ ලියවිලි එහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම පුහුණු හෝ නුපුහුණු සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කරවන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කරණ ප්‍රදේශයෙහිම වූ සේවකයින් පමණක් වැඩයෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්වරයාගෙන් සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් හැම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළා සේ සළකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද, සමත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිවූ ලාංකික නොවූ හෝ වැඩය කරණ ප්‍රදේශයෙහි නොවූ හෝ ලාංකික සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

කේ. අසෝකා ධර්මකීර්ති,
කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 පෙබරවාරි මස 21 දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

2–905—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ මාර්තු මස 20 වැනි සිකුරාද පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

(1) බ/බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලය. වැඩි දියුණු කිරීම.

**සංලක්ෂ්‍යය.**—අංක (1) බ=බදුල්ල;

අංක (2)—අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රජයේ දෙපාර්තමේන්තුවේ අවශ්‍ය ලියාපදිංචි කිරීම :—
අංක (1)—රු. 24,000

2. ඉහත දැක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 3.30 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි, බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්‍ෂට ඉදිරිපත් කිරීමෙන් පසුවය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර, කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්‍ෂගෙන් ලබාගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡෙදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. ඉහත සඳහන් 2 වැනි ඡෙදයෙහි දැක්වෙන පරිදි බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ, සහකාර අධ්‍යාපනාධ්‍යක්‍ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපනාධ්‍යක්‍ෂගෙන් දැනගත හැකියි. සැලැස්මයන්ද එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර මාතලේ අධ්‍යාපන නිළධාරි තැන ගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂ කර බැලිය හැක.

9. තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා දුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිනාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සැම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාසේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩී. එම්. වෙලගෙදර,
මාතලේ අධ්‍යාපන නිළධාරී.

1964 පෙබරවාරි 21 වැනි දින,
මාතලේ අධ්‍යාපන කාර්යාලයේදීය.

2-863/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 මාර්තු මස 20 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාසලේ නම | | කළ යුතු වැඩය |
|---|---|---|---|
| 1. | මී/මිනුවන්ගොඩ නාලන්දා විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ලක් තැනීම |
| 2. | මී/දොරව්ව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 3. | මී/මෙල්ලවගෙදර සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 4. | මී/පොල්වත්ත සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 5. | මී/අරන්ගාව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 6. | මී/හොරම්පැල්ල සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 7. | මී/බලතාව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 8. | මී/ඉදිපරපෙ සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 9. | කො/දූමනැගෙදර සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 10. | කො/උඩුගොඩ සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 11. | කො/තිහාරිය පහලගම සිංහල මිශ්‍ර පාසල | | එම |
| 12. | කො/එලුවාපිටිය සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 13. | කො/පින්ගමුව විද්‍යාලය | ... | එම |
| 14. | කො/පැලහෙල දෙමලගම විද්‍යාලය | ... | එම |
| 15. | කො/බූන්පිටිය සිංහල බාලිකා පාසල | ... | එම |
| 16. | කො/කැරගල සිංහල බාලිකා පාසල | ... | එම |
| 17. | මී/දෙවලපොල මහා විද්‍යාලය | ... | එම |
| 18. | මී/නිල්පනාගොඩ සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 19. | මී/තම්මිට සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 20. | මී/කලුඅග්ගල සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 21. | මී/කොටදෙනියාව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 22. | මී/දාගොන්න රණසිංහ ප්‍රාථමික | ... | එම |
| 23. | කො/උඩුගහවල්පොල සිංහල බාලිකා පාසල | | එම |
| 24. | කො/දඩගමුව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 25. | කො/යබරළුව සිංහල මිශ්‍ර පාසල | ... | එම |
| 26. | කො/කලගෙඩිහේන සිංහල බාලිකා පාසල | | එම |

සංලක්ෂ්‍යය :

කො = කොළඹ දිස්ත්‍රික්කය.
මී = මීගමු දිස්ත්‍රික්කය.

| සටහන 1. | | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | | අනුමත කළ සමිති සමාගම් | |
|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | රු. | ශ. |
| අංක 1 සිට 16 දක්වා | ... | 15,000 | 0 | ... | 15,000 | 0 |
| අංක 17 සිට 21 දක්වා | ... | 12,000 | 0 | ... | 12,000 | 0 |
| අංක 22 සිට 26 දක්වා | ... | 10,000 | 0 | ... | 10,000 | 0 |

2. ඉහත දැක්වෙන පළමුවන සටහන ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ ඊට නො අඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අනුමත කරන ලද විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමූපකාර සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 මාර්තු මස 19 වැනිදා පස්වරු 3.30 වන තුරු නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹ 7, ග්‍රීන්පාත්, අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹින් පිට ඔනෑම දිසාපති කාර්යාලයක අංක 1 සිට 4 වැඩ සඳහා රුපියල් 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක්, කොළඹ 2, කුමාරන් රත්නම් පාර කොළඹ උතුර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමන් වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍රය කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපනාධ්‍යක්ෂකතුමා (ගොඩනැගිලි අංශය) හෝ කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. පූර්වෝක්ත දෙවැනි ඡේදයේ සඳහන් වන පරිදි කොළඹ උතුර, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂකතුමාගෙන් ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමඟය. සියලුම විස්තර සහ තොරතුරු කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයෙන් දැනගත හැකිය. සැලැස්ම එහි දී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහි ම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නමද, ලියා තිබිය යුතු ය.

6. 1964 මාර්තු මස 20 වැනි දින පෙරවරු 10.30 ට කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර, අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තව ද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණය ද, ටෙන්ඩර් කරුවන්ගේ නම ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්කර සති 6 කට නො අඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනාව විවෘත ව තැබිය යුතු යි.

8. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි පරීක්ෂා කර බැලිය හැක.

9. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන් ම කම්කරුවන් හැකිනාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇති ව අධ්‍යාපනාධ්‍යක්ෂකවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සැම විට ම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකලා සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම් ය.

ඊ. නාගොඩවිතාන,
සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ, කොළඹ උතුර.

1964 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ 2, කුමාරන් රත්නම් පාර,
කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ දීය.

2-931/1—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

5. 1964 මාර්තු මස 20 වැනි සිකුරාද පස්වරු 2.30 ට කොළඹ අධ්‍යාපන ෙදපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත රන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට ාසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිළධාරි තැන සින් ගාස්තු ප්‍රමාණයද, (රේට් ගණන්ද) ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, ැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම අවසන් ාර සති හයකට නොඅඩු කාළයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව ැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්කර තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් ෑබා ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදීය යුත්තේ ුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය, ටෙන්ඩරයට ෑයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාසේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත්වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

සී. ඒ. ජී. ප්‍රනාන්දු,
තංගල්ලේ අධ්‍යාපන නිළධාරී.

1964 පෙබරවාරි 19 වැනි දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී ය.

2–838—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 මාර්තු මස 20 සිකුරාදා පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. මාර/දෙසියන්දර මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල. |
| 2. මාර/මාකඳුර මහා විද්‍යාලය | රසායනාගාර ගොඩනැගිල්ල. |
| 3. මාර/මිරිස්ස මහා විද්‍යාලය | රසායනාගාර ගොඩනැගිල්ල. |
| 4. මාර/දික්වැල්ල මුස්ලිම් මහා විද්‍යාලය | රසායනාගාර ගොඩනැගිල්ල. |

සංලක්ෂ්‍යය.—මාර= මාතර දිස්ත්‍රික්කය

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත්කරුවන් රු. 22,000 ට නොඅඩු ගණනකට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී සිටිය යුතුයි.

3. අනුමත කරණ ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති, ගොඩනැගිලි වැඩ සඳහා 2 වැනි ඡේදයේ සඳහන් ගණන්වලට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී ඇත්නම් ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

4. වර්ෂ 1964 මාර්තු මස 19 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කායඝීලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාට ඉදිරිපත් කළ යුතුය. චෙක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය බාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ චව්චර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගෙන් හෝ ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ චව්චර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන දෙවන හා තුන්වන ඡේදයන්ගේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා සමිති වලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡේදයන්හි දැක්වෙන පරිදි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමා ගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියළුම විස්තර හා තොරතුරු මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගෙන් දැනගත හැකිය. සැලැස්මවල්ද එහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔහු හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායඝීල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද, වැඩයේ නම ද ලියා තිබිය යුතුය.

7. වර්ෂ 1964 මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරිතැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මාතර අධ්‍යාපන නිලධාරිතුමාගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සළකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

පී. ඊ. ජී. මැන්ඩිස්,
මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

අධ්‍යාපන කායඝීලය,
මාතර, 1964 පෙබරවාරි මස 22 වෙනි දින.

2–892/1—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 මාර්තු මස 20 වැනි සිකුරාදා පස්වරු 2 වන තෙක් මාතර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ :—

| පාසැලේ නම | කළ යුතු වැඩය |
|---|---|
| 1. මාර/යටියන රජයේ විද්‍යාලය | පාඨශාලා ගොඩනැගිල්ල. |
| 2. මාර/පස්ගොඩ රජයේ විද්‍යාලය | එම |
| 3. මාර/කෝන්ගල ප්‍රාථමික රජයේ විද්‍යාලය | එම |
| 4. මාර/උනැල්ල රජයේ විද්‍යාලය | ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම. |
| 5. මාර/ගොඩගම සී. සී. පාසැල ... | පාඨශාලා ගොඩනැගිල්ල |
| 6. මාර/කහවින්න රජයේ විද්‍යාලය | එම |
| 7. මාර/කාඳුගල අත්තදස්සි විද්‍යාලය | එම |
| 8. මාර/හත්තොටුව රජයේ විද්‍යාලය | එම |
| 9. මාර/කරිවිලකන්ද රජයේ විද්‍යාලය | අළුත් වැඩියාව. |
| 10. මාර/බටවලපාතෙගම රජයේ විද්‍යාලය | එම |
| 11. මාර/ගොඩපිටිය මුස්ලිම් රජයේ විද්‍යාලය | එම |
| 12. මාර/අකුරුගොඩ රජයේ විද්‍යාලය | ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම. |
| 13. මාර/කිරින්ද බාලිකා රජයේ විද්‍යාලය | අළුත් වැඩියාව. |
| 14. මාර/දික්වැල්ල මධ්‍ය මහා විද්‍යාලය | පාඨශාලා ගොඩනැගිල්ල |

සංලක්ෂ්‍යය.—මාර = මාතර දිස්ත්‍රික්කය

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්කරුවන් වැඩ අංක 1 සිට 10 දක්වා වැඩ සඳහා රු. 7,500 ට නොඅඩු ගණනකටද, වැඩ අංක 11 සිට 12 දක්වා වැඩ සඳහා රු. 3,000 ට නොඅඩු ගණනකටද, වැඩ අංක 13 සඳහා රු. 10,000 ට නොඅඩු ගණනකටද, වැඩ අංක 14 සඳහා රු. 15,000 ට නොඅඩු ගණනකටද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිය යුතුය.

3. අනුමත කරණ ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති, ගොඩනැගිලි වැඩ සඳහා 2 වැනි ඡේදයේ සඳහන් ගණන්වලට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිවී ඇත්නම් ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

4. වර්ෂ 1964 මාර්තු මස 19 වෙනි දා පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාට ඉදිරිපත් කළ යුතුය. චෙක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය බාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගෙන් හෝ ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන දෙවන හා තුන්වන ඡේදයන්ගේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා සමිති වලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡේදයන්හි දැක්වෙන පරිදි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමා ගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියළුම විස්තර සහ තොරතුරු මාතර අධ්‍යාපන නිලධාරී තුමාගෙන් දැනගත හැකිය. සැලැස්මවල්ද එහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔහු හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මාතර අධ්‍යාපන කාර්යාලයේ/කාර්යාල සහකාර නිලධාරී තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද, වැඩයේ නම ද ලියා තිබිය යුතුය.

7. වර්ෂ 1964 මාර්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ මාතර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. නවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරිතැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මාතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහි පරීක්ෂාකර බැලිය හැක.

10. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සළකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

පී. ටී. ජී. මැන්ඩිස්,
මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ

අධ්‍යාපන කාර්යාලය,
මාතර, 1964 පෙබරවාරි මස 22 වෙනි දින.

2–892/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් මසකට කියුබ් 100 බැගින් අඟල් 1 1/2 කොරල් ගල් කියුබ් 800ක් කන්කසන්තුරේ දුම්රිය අංගනයටත්, සිමෙන්ති කම්හලට යන මාර්ගය අසලටත් සහ ප්‍රධාන මාර්ගය අසලටත් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1964 මාර්තු 13 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්මද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන, ලං. දු. දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1964.2.21 දින,

2–921—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව

### විදුලි උපකරණ සපයා සවිකිරීමේ ටෙන්ඩරය

1964 පෙබරවාරි 14 වෙනි දින ගැසට් පත්‍රිකාවේ නිවේදනයට අමතරව කරුණාකර පහත සඳහන් දේ සටහන් කර ගන්න:—

(අ) ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 1964 මාර්තු මස 17 වෙනි ද සවස 2.00 තෙක් දීර්ඝ කර ඇත.

(ආ) ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1964 මාර්තු මස 2 වෙනි ද සවස 3.00 තෙක් දීර්ඝ කර ඇත.

ඕ. ඩී. ඩබ්ලිව්. ජේ. ඊ. අබෙයරත්න,
සැපයීම් නිලධාරී.

ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව,
සැපයීම් සහ වාප්‍ප දෙපාර්තමේන්තුව,
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

2–759—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## දෙපාර්තමේන්තුව—මාතර දිසාපති

1964 වර්ෂය තුළ මාතර නගර සීමාව තුළ පිහිටි මාතර දිසාපති කාරයේ ඇති පාලන ගොඩනැගිලි හා පොදු සේවා නිවාස ආදියෙහි වැඩිදියුණු කිරීම්, සුළු අළුත් වැඩියාකිරීම්, නඩත්තු කිරීම් හා ජල සේවය නඩත්තු කිරීම ද සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මා විසින් 1964 වර්ෂයේ මාර්තු මස 14 වන දා පෙ. ව. 10.00 දක්වා මාතර කච්චේරියේ දී භාරගනු ලැබේ. ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන සියළු ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර මෙ දිනට පෙර ලැබීම සඳහා මා වෙත එවිය යුතුය.

2. මගේ කාර්යාලයෙන් ලබාගන්නා ආකෘති පත්‍ර වල ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුව ඇත. මේ සම්බන්ධව සියළු විස්තර මේ කාර්යාලයෙන් ලබා ගත හැකිය. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට හා මාතර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සංගම් හා ග්‍රාම සංවර්ධන සමිති වලට ද ටෙන්ඩර් පත්‍ර 1964 මාර්තු 12 ද අ. භා. 3.00 දක්වා ලබා ගත හැකිය. සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති හැර සෙසු කොන්ත්‍රාත්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලබාගත යුත්තේ ඒ සඳහා මා වෙත රුපියල් 10,000 ක තැන්පත් මුදලක් මාතර කච්චේරියේ තැන්පත් කිරීමෙන් පසුවය.

හැ. රෝ. අමීට්,
මාතර දිසාපති.

1964. 2. 22 දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

2–902—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

පයින්ට් බාගේ වීදුරු කිරි බෝතල් ග්‍රොස් 12,000 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1964 අප්‍රේල් මස 15 වැනි බදාදා පස්වරු 2 දක්වා බාරගනු ලැබේ.

මේ කායර්ාලයේ සරප්ට රු. 150 ක් ආපසු දෙනු ලබන තැන්පත් මුදලක් ගෙවා, කුවිතාන්සිය එහි මණ්ඩලික සහකාර වෙත ඉදිරිපත් කිරීමෙන් 1964 අප්‍රේල් මස 14 වැනි අඟහරුවාදා පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත් ලබාගත හැක.

වැඩි විස්තරද එම මාණ්ඩලික සහකාරගෙන් ලබාගත හැක.

ඇම්. බී. සල්මන්
සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය ප්‍රධාන කායර්ාලය,
නාරාහේන්පිට,
කොළඹ 5,
1964.2.19.

2–834—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ, වීරිපොලි වෙළඳ හලට, වීරිපොලි වෙළඳ හලෙහි පිහිටි ආරෝග්‍යශාලා ආහාර සැපයීමේ මූලස්ථානයට, බොරැල්ලේ මුළුතැන්ගෙයට හා බේකරියට 1964.4.1 සිට 1964.9.30 දින දක්වා ගවමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පේදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර හා සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 මාර්තු මස 16 වැනි දින අ. භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතම් වීදියේ අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1964.3.16 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 පෙබරවාරි මස 20 දින,
කොළඹ 1,
අලෙවිකිරීමේ කොමසාරිස් කායර්ාලයේ දීය.

2–817—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන්ට 1964.4.1 සිට 1964.9.30 දින දක්වා බටර් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර සහ සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 මාර්තු මස 16 වැනි දින අ. භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරණ, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 50ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1964.3.16 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 පෙබරවාරි මස 20 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ දීය.

2–816—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට සහ බොරැල්ලේ මුළුතැන්ගෙයට 1964.4.1 සිට 1964.9.30 දින දක්වා ලෙලි රහිත පොල් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර සහ සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 මාර්තු මස 16 වැනි දින අ. භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, වැනැම් වීදියේ, අංක 62 දරණ, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 200ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාතීමේන්තුවට ඉදිරිපත් කළ විට 1964.3.16 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

මි. ස. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 පෙබරවාරි මස 20 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ දීය.

2–815—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් කැඳවීම්

### හම්බන්තොට කච්චේරිය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1964, මාර්තු මස 19 දින ප. ව. 3.00 දක්වා මා විසින් ටැන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

1. පත්නගමුව පාරේ පළමුවැනි සැතපුමේ බෝක්කු තැනීම-මාගම් පත්තුව
2. ඕබඩගහදෙනිය-හුලංකන්දපාරේ බෝක්කු තැනීම-උතුරු ගිරුවා පත්තුව.

2. ටෙන්ඩර් පත්‍ර වෙන් වෙන් වශයෙන් එවිය යුතුයි. ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර 1964 මාර්තු මස 18 වැනි දින පස්වරු 3.00 දක්වා ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය එම ආකෘති පත්‍ර ඉල්වීමට ප්‍රථම ඒ සඳහා රු. 10ක මුදලක් කච්චේරියේ තැන්පත් කර, ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. තෝරාගත් ටෙන්ඩර් කරු තම කර්තව්‍යය නිසියාකාර කරන බවට රජය හා ගිවිසුම් පත්‍රයකට අත්සන් තැබීමෙන් අනතුරුව මෙම ඇප මුදල ගෙවනු ලැබේ.

3. කාර්යාලයීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 මාර්තු 19 දින ප. ව. 3.00 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. මේ වේලාවට ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට අවසර දෙනු ලැබේ.

4. ඉහත සඳහන් කාර්යය සඳහා එවනු ලබන සෑම ටෙන්ඩර් පත්‍රයක්ම තනි කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ වැඩේ නම සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එක් කවරයක බහාලිය යුත්තේ එක් ටැන්ඩර් පතක් පමණි.

5. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අකමැත්තෙහි නම් ඔහු හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු විසින් එම ටෙන්ඩර් පත්‍රය සහිත කවරය හම්බන්තොට දිසාපති තුමාට පෞද්ගලිකව පැමිණ භාරදිය යුතුයි. එවිට එම ටෙන්ඩරය ලැබුණු බවට ලියවිල්ලක් එතුමාගෙන් ලැබේ.

6. පිළිගනු ලැබූ ටෙන්ඩරයක් පසුව ප්‍රතික්ෂේප වී නවත් ටෙන්ඩරයක් පිළිගැනීමට ඉඩ තිබෙන බැවින් එම ටෙන්ඩරය පිළිගැනුනහොත් එහි සඳහන් පරිදි කටයුතු ඇරඹීමට යටත් පිරිසෙයින් ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 45 ක් ගත වනතුරු වත් සෑම ටෙන්ඩර්කරුවෙක්ම සූදානම්ව සිටිය යුතුයි.

7. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට ප්‍රථම තම ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 10 ට වැඩි නොවන මුදලක් හම්බන්තොට දිසාපති තුමා වෙනුවෙන් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතුයි. තම කාර්යය නිසි අයුරු හා සතුටුදායක පරිදි ඉටුකරන බවට ඇපයක් වශයෙන් සැළකෙන මෙම මුදල එසේ තැන්පත් කිරීමට සෑම ටෙන්ඩර් කරුවෙකුටම හැකියාව තිබිය යුතුයි. කටයුතු අවසාන වී ඒ සඳහා රජයෙන් ගෙවිය යුතු මුළු මුදලම ගෙවා නිමවී තෙමසක් ගතවූවාට පසු එම ඇප මුදල ගෙවනු ලැබේ.

8. කිසිදු කරුණක් නොපෙන්වා ටෙන්ඩර් පත්‍ර එකක් හෝ වැඩි ගණනක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තැන සතුය.

එෆ්. ජේ. ජී. කැස්පර්ස්
හම්බන්තොට වැ. බ. ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1964. 2. 18 දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

2–884—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

8′ × 4′ × 24 මිම්මේ පැතලි ගැල්වනයිස් යකඩ තහඩු 5000ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1964 මාර්තු මස 25 වැනි බදාදා පෙරවරු 11.00 වන තෙක් බාර ගනු ලැබේ. 1964 මාර්තු මස 26 දින පෙරවරු 10.00 ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටැන්ඩර් විවෘත කරන අවසථාවේදී ටැන්ඩර්කරුවන්ට ඉදිරිපත් විය හැක.

2. කොලොන්නාවේ රජයේ කම්හන්තශාලාවේ කම්හන්තශාලා ඉංජිනේරු තැනගේ කායඹාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර කම්හන්තශාලා ඉංජිනේරුතැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තන්පත් මුදල් අනවශ්‍යය.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන :—චීන ජාතික යන්ත්‍රොපකරණ ආනයන සංසථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. " ලාංකික කරණ ලද මූලාංශ වලින් " එනම්, ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ඇස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුඇනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් සමාජ වාදී එක්සත් සමූහාණ්ඩුව සහ යුගෝස්ලේවියා ආදි රටවලින් බඩු ගෙන්වා සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද පොදු ආනයන බල පත්‍රයක් ඇති ලියා පදිංචි කළ ලාංකික වෙළඳුන් විය යුතුය.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 64. 2. 24.

2–932—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මාතර නව රෝහල තැනීමේ 1 වන පියවර යටතේ 4ඒ ශ්‍රේණියේ නිවාස 4ක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස් වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 1 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මාතර ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 මාර්තු මස 13 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,70,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1964.2.24.

2–935/1—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

හොරණ රජයේ රෝහලේ ශල්‍යාගාරයක් සහ වාට්ටු දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 1 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කළුතර ර. වැ. දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 මාර්තු මස 13 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,10,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1964.2.24.

2–935/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් දැන්වීම් සංශෝධනයක්

මුලතිව් රෝහලේ මුලුතැන් ගෙයක් තැනීම සඳහා 1964 පෙබරවාරි මස 7 වැනි දින අංක 13,944 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ 171 වැනි පිටුවේ පළ කර ඇති ටෙන්ඩර් දැන්වීමේ 3 වැනි ඡේදය පහත සඳහන් අයුරු වියයුතු බව මෙයින් දන්වනු ලැබේ.

"3. වර්ෂ 1964 මාර්තු මස 6 වැනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 90,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට,

(අ) තමන්ගේ ලියාපංදිචිය පිළිබඳ ලියකියවිලි සහ,

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට ටෙන්ඩර්පත් ලබාගත හැකිය."

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්‍ෂක වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964.2.24.

2–935/3—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1964 ජනවාරි මස තුළ ටෙන්ඩර් පිළිබඳ තීරණ

| සේවය | ටෙන්ඩර් | සාර්ථකවූ ටෙන්ඩර් කරුවන් හා පිළිගත් ගාස්තු |
| --- | --- | --- |
| ට්‍රැක්ටර් සහ ට්‍රෙලර් සැපයීම ... ... | 23 | |
| (අ) ස්වයංකාරී ඞීව් එකක් සමඟ ට්‍රැක්ටර් 32ක් ... | | ... සීමාසහිත බ්‍රවුන් සහ සමාගම ට්‍රැක්ටරයක් පවුම් 625 ගණනේ කිරුළපනයට ගෙනැවිත් භාරදීමට, ණයවර ලිපිය රජයෙන් |
| (ආ) ට්රේලර්ස් 32ක් (ටොන් 5ක් අල්ලන) ... | | ... විදේශ ආණ්ඩු හා පාලන (ආයතනයන්හි) ක්‍රවුන් ඒජන්තවරු ප: 6041—0—0 වට්නාකම හා කොළඹට නැව් ගාස්තුව |

2–923—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

| වැඩ විස්තරය | ලැබුණු මුළු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මුදල |
| --- | --- | --- | --- |
| | | | රු. ශ. |
| මුලතිවු උප කොටසේ මුතුඅයියන්කඩ්ඩු කුලම් ප්‍රධාන ඇලේ වම් ඉවුරේ සැතපුම් දෙකේ සිට පහ දක්වා තැනීම—ටෙන්ඩර් | 1 | ... සීමාසහිත මක්පිෆ්ස්ටර්ස් (පෞද්ගලික) සමාගම, කොළඹ 3 ... | 2,58,725 00 |

ආර්. එස්. ධර්මානන්දර්,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු,
උතුරු කොට්ඨාශය.

1964 පෙබරවාරි මස 19 වැනි දින,
වවුනියාවේදී ය.

2–880—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් සඳහා ගත් අවසාන තීරණ

| සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | තෝරාගත් ටෙන්ඩරකරුගේ නම | පිළිගත් ගණන | රු. ශ. |
|---|---|---|---|---|
| 1. 1964.1.1 සිට 1964.6.30 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනයන්ට එළුමස් සැපයීම | 1 ... | කේ. ඒ. ඇම්. ඒ. අසීස් මහතා,<br>166/19, නාරාහේන්පිට පාර,<br>කොළඹ 8. | ... (1) පපු මස (ස්ටූ සඳහා) ...<br>(2) එළුමස් (25% කටු සහිතයි) ...<br>(3) වකුගඩු ... ...<br>(4) පිකුදු ... ...<br>(5) සුප් මස් ... ...<br>(6) දිව (එකක්) ... ...<br>(7) එළු මස් (කටු රහිත) ...<br>(8) මොලය (එකක්) ...<br>(9) හදවත ... ... | 1 20<br>1 95<br>2 50<br>2 50<br>0 75<br>0 40<br>2 25<br>0 50<br>2 50 |
| 2. 1964.1.1 සිට 1964.6.30 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනයන්ට දර සැපයීම | 2 ... | කේ. ඩී. සී. සිරිවර්ධන මහතා<br>පල්ලේගොඩ පාර,<br>වලගෙදර | ... මුළුතැන්ගෙය—<br>3′ × 4″ × 3″ ප්‍රමාණයේ රබර් දර හො.1ක් රු. 1.75 බැගින් ගෙනැවිත් භාර දීමට<br>බේකරිය—<br>3′ × 3″ × 3″ ප්‍රමාණයේ රබර් දර හො. 1ක් රු. 1.55 බැගින් ගෙනවිත් බාරදීමට.<br>ටිං කිරීමේ කම්හල—<br>3′ × 4″ × 3″ සහ 2′ × 4″ × 3″ ප්‍රමාණයේ රබර් දර හො. 1ක් රු. 1.75 බැගින් ගෙනැවිත් භාරදීමට. | |
| 3. 1964.1.1 සිට 1964.12.31 දක්වා රෙදි පිරිසිදු කිරීම | 1 ... | මහරගම, විවිධ සේවා සමූපකාර සමිතිය | ... (1) වේටර් රෙදි 1ක් ...<br>(2) වේටර් කෝට් 1ක් ...<br>(3) මේස රෙදි 1ක් ...<br>(4) ෂීට් 1ක් ... ...<br>(5) ඒප්‍රන්ස් 1ක් ... ...<br>(6) උඩ කබා 1ක් ... ...<br>(7) තුවා 1ක් ... ...<br>(8) හිස්වැසුම් ... ...<br>(9) පිස්න ... ...<br>(10) අනික්කුත් කෑලි 1ක් ... | 0 25<br>0 32<br>0 20<br>0 40<br>0 25<br>0 50<br>0 10<br>0 12<br>0 12<br>0 12 |
| 4. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටිං කිරීමේ කම්හලට තුනපහ කුඩු කිරීම සහ ඇඹරුම් යන්ත්‍රවල තල මුවහත් කිරීම | 2 ... | — | ... — | |
| තුනපහ කුඩු කිරීමට ... | 1 ... | — | ... — | |
| තල මුවහත් කිරීමට ... | 1 ... | එච්. ඇම්. ඩී. [illegible]<br>134/1, විහාර පටුමඟ,<br>කොළොන්නාව, වැල්ලම්පිටිය | ... තල ජෝඩුවක් ... ... | 9 0 |
| 5. 1964.1.1 සිට 1964.12.31 දක්වා සුරුට්ටු, දුම්කොළ සැපයීම | 2 ... | ඇස්. ජේ. රාජු ...<br>කුලේන්ද්‍ර ස්ටෝර්ස්,<br>1, හෙට්ටි වීදිය,<br>කොළඹ 11 | ... සුරුට්ටු 1,000ක් රු. 23 බැගින්<br>රට දුම්කොළ 1,000ක් රු. 150 බැගින්<br>සිංහල දුම්කොළ 100ක් රු. 18 බැගින්<br>හුණු රාත්තල් 100ක් රු. 12 බැගින් | |
| 6. පාවිච්චි කළ නොහැකි බයිසිකල් මිළ දී ගැනීම සහ ගෙනයාම | 13 ... | ඩී. ඩී. ගල්හේනගේ ...<br>44, සීමන්ස් පාර,<br>මරදන. | ... බයිසිකල් 27ක් රු. 1,127.00 යි | |
| 7. කොම්ප්‍රෙස්ඩ් ඊස්ට්, බේකරින්, සැන්ටිනල් සහ එළවළු තෙල් මෙම දෙපාර්තමේන්තුව සතු බොරැල්ල බේකරියට ගෙනැවිත් බාර දීම පිණිස | 2 ... | — | ... — | |
| (එළවළු තෙල්) ... ... | 1 ... | සීමාසහිත ලිවර් සහෝදරයෝ,<br>258, ග්‍රෑන්ඩ් පාස් පාර,<br>කොළඹ 14 | ... රාත්තල රු. 1 යි | |
| කොම්ප්‍රෙස්ටඩ්ස්ට් බේකරින් සහ සැන්ටිනල් | 1 ... | සීමාසහිත ගිල්බට් සහ රිචඩ්<br>215, කොල්ලුපිටිය, කොළඹ 3 | ... (අ) කොම්ප්‍රෙස්ඩ්ඩ්ස්ට් රාත්තල් ...<br>(ආ) බේකරින් රාත්තල් ...<br>(ඉ) සෙන්ටිනල් රාත්තල් ... | 2 05<br>1 75<br>2 55 |
| 8. අලෙවි කිරීම් දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ටිං කිරීමේ කම්හලට පොලිතීන් මළු සැපයීම | 1 ... | මුසාජී පුත්‍රයෝ, ...<br>240, වෙල්ල වීදිය,<br>කොළඹ 12. | ... රාත්තල් ¼ක් ප්‍රමාණ මළු 1,000ක් ...<br>රාත්තල් ½ක් ප්‍රමාණ මළු 1,000ක් ...<br>රාත්තල් 1ක් ප්‍රමාණ මළු 1,000ක් ... | 30 0<br>38 0<br>58 0 |
| 9. මරදානේ ත්‍රිපොලි වෙළඳ සැලේ බිත්තර ගබඩාවට කාඩ්බෝඩ් පෙට්ටි සැපයීම | 2 ... | ඇස්. ඇම්. ඇම්. බුහාරි,<br>86, හෙට්ටි වීදිය,<br>කොළඹ 11. | ... පෙට්ටි 100ක් සාද ගෙනැවිත් බාරදීමට ... ... | 390 0 |
| 10. 1964.1.1 සිට 1964.12.31 දක්වා මුළුතැන් ගෙට කැන්ද කොළ සැපයීම | 4 ... | ඩී. කේ. ඩේවිඩ්, ...<br>319, පට්ටිය,<br>පැලියගොඩ,<br>කැළණිය | ... කැන්ද කොළ 100ක් ශත 45 බැගින් ගෙනැවිත් බාරදීමට | |

| සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | තෝරා ගත් ටෙන්ඩර් කරුගේ නම | පිළිගත් ගණන |
|---|---|---|---|
| 11. 1963.12.1 සිට 1964.12.31 දක්වා නාරාහේන්පිට ඊං කිරීමේ ආයතනයේ තණ පිට්ටනි බදුදීම | 4 ... | ඇස්. සුබ්‍රමණියම් ... 29, ක්ලිෆර්ඩ් පාර, කොළඹ 3. | ... අක්කර 4ක ප්‍රමාණයේ තණකොළ කපාගෙන යාම පිණිස රු. 655 |
| 12. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ පුත්තලම් ශාඛාවට ප්‍රවාහන සේවා සැපයීම | 1 ... | ඇසෙන්කුඩුස් අබ්දුල්බසීර් 72, කුරුණෑගල පාර, පුත්තලම. | ... මාසයකට රු. 240 ගණනේ |
| 13. ත්‍රිපොලි වෙළඳ සැලේ බිත්තර ගබඩාවට බිත්තර ඇහිරීමට ලී පෙට්ටි සැපයීම | 7 ... | සීමාසහිත වැකඩ වඩු සමූපකාර සමිතිය, පානදුර. | පෙට්ටි 100ක් රු. 795 ගණනේ |

අ.වී.ර. පෙරේරා,
වැ.බ. අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

2-837—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### 1964 ට මීගමුවේ පෙරියමුල්ලේ පිඟන් කම්හලට පෙල්ස්පා කැණීමේ සහ සැපයීමේ ටැන්ඩරයේ ප්‍රතිඵල

| | ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ටුවමනා ප්‍රමාණය | දක්වූ මිළ ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | ඩී. ආර්. දෙල්පේ මහතා, තිරුවාන වතුයාය, පරකඩුව ... | ... ටොන් 100 | ... රු. 75 ටොන් එකකට |
| 2. | එච්. වීරසිංහ මහතා, 5, රෝස් වීදිය, මාතලේ ... ... | ... ටොන් 100 | ... රු. 69 ටොන් එකකට |

එච්. වීරසිංහ මහතාගේ ටෙන්ඩරය පිළිගන්නා ලදී.

ඕ. ඩී. ඩබ්. ජේ. ඊ. අබෙයරත්න.
සැපයීම් නිලධාරි.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

2-990/1—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### 1964 ට මීගමුවේ පිඟන් කම්හලට තිරුවාන සැපයීමේ ටැන්ඩරයේ ප්‍රතිඵල

| | ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ටුවමනා ප්‍රමාණය | දක්වූ මිළ ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | ජැපර්ජී සහෝදරයෝ, 150, ශාන්ත ජෝශප් වීදිය, කොළඹ 14 ... | ... ටොන් 480 | ... ටැන්ඩරයේ ඉදිරිපත් කර නැත |
| 2. | ඩී. ආර්. දෙල්පේ මහතා, තිරුවාන වතුයාය, පරකඩුව ... | ... ටොන් 480 | ... ටොන් එකකට රු. 69·50 |

ඩී. ආර්. දෙල්පේ මහතාගේ ටැන්ඩරය පිළිගන්නා ලදී.

ඕ. ඩී. ඩබ්. ජේ. ඊ. අබෙයරත්න,
සැපයීම් නිලධාරි.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

2-990/2—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### 1964-66 ට බොරලැස්ගමුවේ පිඟන් මැටි ශුද්ධාගාරයට අමු කැඔලින් කැණීම, වෙන්කිරීම සහ බෙදීමේ ටැන්ඩරයේ ප්‍රතිඵල

| | ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ටුවමනා ප්‍රමාණය | දක්වූ මිළ ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | ඩී. ආර්. බී. ජයමහ මහතා, " ජ්ලැසීඩා ", වැල්ලබොඩ, පමුණුගම | කියුබ් 3600 අවුරුද්දකට (අවුරුදු 5 ක කාලයකට) ... | රු. 48·00 කියුබ් එකකට |
| 2. | එස්. ඒ. ඇම්. මොහිදීන් සහ සමාගම, 323, හැව්ලොක් පාර, කොළඹ 6 | කියුබ් 3600 අවුරුද්දකට (අවුරුදු 5 ක කාලයකට) ... | රු. 199·50 කියුබ් එකකට |
| 3. | එච්. ඇම්. නවරත්න මහතා, 95, ස්ටැන්ලි පෙදෙස, කොළඹ 10 | කියුබ් 3600 අවුරුද්දකට (අවුරුදු 5 ක කාලයකට) ... | රු. 50·50 කියුබ් එකකට |

ඩී. ආර්. බී. ජයමහ මහතාගේ ටැන්ඩරය අවුරුදු 3 ක කාලයකට පිළිගන්නා ලදී. එහෙත් අවුරුදු 5 තෙක් දීර්ඝ කිරීමට හැකිය.

ඕ. ඩී. ඩබ්. ජේ. අබෙයරත්න,
සැපයීම් නිලධාරි.

ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

2-990/3—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

1964 මාර්තු මස 6 වෙනි සිකුරාදා පෙරවරු 10ට නැගෙනහිර දිසාවේ, දිසා වන නිලධාරි විසින් තේක්ක, බුරුත, හල්මිල්ල, රානි, හුලන්හික් ආදි කොට ඇති ඝන අඩි 928 කට සමාන කඳන් 152ක් මඩකලපුව මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවනට පරීක්ෂාකර බැලිය හැක. මෙයට අදාල වැඩි විස්තර නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි ගෙන් හෝ මඩකලපුව දැව ගබඩාවේ ගබඩා පාලකගෙන් ලබාගත හැක.

වී. රා. නානායක්කාර,
දිසා වන නිලධාරී, නැගෙනහිර දිසාව.

දිසා වන කායඃාලය,
මඩකලපුව,
18.2.64.

2–859—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිවාස සඳහා ඉල්ලුම්පත්‍ර—ගොංගිතොට ජාතික නිවාස යෝජනා ක්‍රමය

### 1 ඩබ්ලිව් වර්ගයේ නිවාස 7 යි—1. ඩබ්. 4 වර්ගයේ නිවාස 20 යි

වත්තල ගොංගිතොට නිවාස ක්‍රමයේ සාදා ගෙන යනු ලබන කුලියට සින්නවීමේ ක්‍රමයට දියහැකි අඩුකුලී නිවාස වර්ග දෙකක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රු. 400ට නොවැඩි අය.

(ආ) තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් ගෙයක් හෝ ගෙයක් තැනීමට සුදුසු ඉඩමක් නොමැති අය.

(ඇ) මෙම දැන්වීමේ සඳහන් නිවාස යෝජනා ක්‍රමයේ සිට සැතපුම් 7 ක අධි විෂ්කම්භයක් තුළ රැකියාවේ නියුතු හෝ අවුරුදු 10 ට නොඅඩු කාලයක් ස්ථිරව පදිංචිව ඇති හෝ උප්පත්තියෙන්ම එම පළාතෙහි අයිතිවාසිකම් ලබා ඇති අය.

2. නිවාස පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 12 සිට 15 අතර පමණවූ ඉඩමකය. නිවාස වර්ග දෙක 1 ඩබ්ලිව් සහ 1 ඩබ්ලිව් 4, යනුවෙන් හැඳින් වේ. අවුරුදු 25 කින් නිවසේ වටිනාකම ගෙවී යන පරිදි නිවාස කුලිය සකස් කර ඇත. 1 ඩබ්ලිව් වර්ගයේ නිවසක මාසික කුලිය රු. 44 පමණ වේ. 1 ඩබ්ලිව් 4 වර්ගයේ නිවසක මාසික කුලිය රු. 36 පමණ වේ. මේ සඳහා ඉල්ලුම් පත් එවීමට පෙර මෙම නිවාස ඔබට සුදුසුදැයි පරීක්ෂා කර බැලිය යුතුය. ඔබට අවශ්‍ය නිවාස වර්ගයත් ඔබට ගෙවිය හැකි නිවාස කුලියත් නිවැරදිව ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

3. නිවාසයන්හි ඉඩකඩ විස්තර—

(අ) 1 ඩබ්ලිව් වර්ගය :—ඉදිරිපස ආලින්දය, විසිත්ත කාමරය, නිදන කාමරය, පිටුපස ආලින්දය, කුස්සිය, ජල මුද්‍රිත වැසිකිලිය යනුවෙනි.

(ආ) 1 ඩබ්ලිව් 4 වර්ගය :—ඉදිරිපස විවෘත ආලින්දය, නිදන කාමරය. කාමරය, පිටුපස විවෘත ආලින්දය, කුස්සිය, ජල මුද්‍රිත වැසිකිලිය යනුවෙනි.

4. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශේෂව තිබෙන මුදල එක විටම ගෙවා දැම්මත් සමගම ගෙයි නිත්‍යානුකූල අයිතියත් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගිය දා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළයුතුවා පමණක් නොව, ගෙවල් කුලියද වරිපනම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතු වේ.

5. ඉදිරි කාලයේදී පොදු පහසුකම් ආදිය සඳහා මුදලක් වියදම් කිරීමට සිදුවුවහොත් එම මුදල් නිවාස ක්‍රමයේ පදිංචිකරුවන්ගෙන් සම සමව කොටස් වශයෙන් ඉතිරි කාලය ඇතුළත අයකරනු ලැබේ.

6. නිවාසයේ පදිංචිය සඳහා සුදුසු තැනැත්තා තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසිනි.

7. ඉල්ලුම්පත් පිළියෙළ කළ යුත්තේ මගේ කාර්යාලයෙන් නොමිලයේ ලබාගත හැකි විශේෂ ආකෘතිපත් වලය.

8. පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ජාතික නිවාස කොමසාරිස් තැන වෙත පහත සඳහන් ලිපිනයට 1964 මාර්තු 21 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

ජාතික නිවාස කොමසාරිස්,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

9. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට දින 21ක් ගතවූ පිට එය ලැබුණ බවට දැන්වීමක් නොලැබුණහොත් ඒ බව තැපැල් කාර්යාලයේ ලියා පදිංචි කරන ලද ලිපියකින් මා වෙත දැන්විය යුතුය. ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ “ගොංගිතොට නිවාස ක්‍රමයේ නව නිවාස සඳහා ඉල්ලුම් පත්” යයි සඳහන් කළ යුතුය.

ඩී. පී. ඊ. ඒ. ද ශ්‍රේපාන්සේකා,
ජාතික නිවාස කොමසාරිස්.

කොළඹ 2.

2–554—64.2.28 දින අංක 13,961 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි “ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්” හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි